278 වන කාණ්ඩය - 04 වන කලාපය
தொகுதி 278 - இல. 04
Volume 278 - No. 04

2020 සැප්තැම්බර් 25 වන සිකුරාදා
2020 செப்ரெம்பர் 25, வெள்ளிக்கிழமை
Friday, 25th September, 2020

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:**
මහජන ආරක්ෂක ප්‍රකාශනය

**නිවේදන:**
විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම
පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම
අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා: සාමාජිකයන් නම් කිරීම

**මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව**

**විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ශෝක ප්‍රකාශය :**
ගරු ආර්.එම්.කේ.බී. රත්නායක මහතා


---

# பிரதான உள்ளடக்கம்


**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

**அறிவிப்புக்கள்:**
அரசியலமைப்புக்கான இருபதாவது திருத்தம் சட்டமூலம் : உயர் நீதிமன்றுக்கு மனுக்கள்
பொது மனுக்கள் பற்றிய குழு: உறுப்பினர்கள் நியமனம்
பின்வரிசை உறுப்பினர் குழு: உறுப்பினர்கள் நியமனம்
அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்: உறுப்பினர்கள் நியமனம்

**நிதி ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**கணக்காய்வுச் சேவை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**அனுதாபத் தீர்மானம்:**
மாண்புமிகு ஆர்.எம்.கே.பீ. ரத்நாயக்க


---

# PRINCIPAL CONTENTS


MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation

ANNOUNCEMENTS:
Twentieth Amendment to the Constitution Bill: Petitions to the Supreme Court
Committee on Public Petitions : Nomination of Members
Backbencher Committee: Nomination of Members
Ministerial Consultative Committees: Nomination of Members

PERFORMANCE REPORT OF THE FINANCE COMMISSION

PERFORMANCE REPORTS OF THE AUDIT SERVICE COMMISSION

ORAL ANSWERS TO QUESTIONS

VOTE OF CONDOLENCE:
Hon. R.M.K.B. Ratnayake

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2020 සැප්තැම්බර් 25 වන සිකුරාදා***
*2020 செப்ரெம்பர் 25, வெள்ளிக்கிழமை*
*Friday, 25th September, 2020*

**පූ. භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත සඳහන් සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/7

2020 සැප්තැම්බර් මස 21 වන දින

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

**ගෝඨාභය රාජපක්ෂ**

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
### அரசியலமைப்புக்கான இருபதாவது திருத்தம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
### TWENTIETH AMENDMENT TO THE CONSTITUTION BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව "විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් නවයක පිටපත්, 2020.09.24 දින මා විසින් කරන ලද නිවේදනයේ සඳහන් පෙත්සම්වට අමතරව, මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

### මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම
### பொது மனுக்கள் பற்றிய குழு: உறுப்பினர்கள் நியமனம்
### COMMITTEE ON PUBLIC PETITIONS: NOMINATION OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 122. (1)හි විධිවිධාන සහ 2020 අගෝස්තු 28 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, තේරීම් කාරක සභාව විසින්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරයන් ද නම් කරන ලද බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

ගරු කුමාර වෙල්ගම මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා

### පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම
### பின்வரிசை உறுப்பினர் குழு: உறுப்பினர்கள் நியமனம்
### BACKBENCHER COMMITTEE: NOMINATION OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 126.(1) සහ (2)හි විධිවිධානවල සහ 2020 අගෝස්තු 28 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ දී පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවේ සේවය කිරීම සඳහා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන

[ගරු කථානායකතුමා ]

සංවිධායකවරයා සභාපතිවරයා වූ ද, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සමඟ මතු සඳහන් මන්ත්‍රීවරුන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

ගරු සු. නෝගරාදලිංගම් මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු කපිල අතුකෝරල මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා: සාමාජිකයන් නම් කිරීම
## அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்: உறுப்பினர்கள் நியமனம்
## MINISTERIAL CONSULTATIVE COMMITTEES: NOMINATION OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා 28ක් පත් කළ යුතු බව පාර්ලිමේන්තුව විසින් 2020 සැප්තැම්බර් මස 08 වෙනි අඟහරුවාදා සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව එක් එක් අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් නම් කරන ලද සාමාජික මන්ත්‍රීවරයන්ගේ නම් සියල්ලම මවිසින් **සභාගත*** කරනු ලබන අතර, ඒවා හැන්සාඩ් වාර්තාවේ භාෂා ත්‍රිත්වයෙන්ම පළ කරනු ලබන බවත් මෙම පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

***සභාමේසය මත තබන ලද නාමලේඛනය:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட பெயர்ப் பட்டியல் :*
*List of names tabled:*

1. ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු අනුර දිසානායක මහතා
   ii. ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා

2. මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු පාඨලී චම්පික රණවක මහතා
   ii. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

3. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු බුද්ධික පතිරණ මහතා
   ii. ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා

4. නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු මනෝ ගනේෂන් මහතා
   ii. ගරු මුජිබුර් රහුමාන් මහතා

5. අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
   ii. ගරු සී.වී. විග්නේෂ්වරන් මහතා

6. විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
   ii. ගරු සාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

7. රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු ජේ.සී. අලවතුවල මහතා
   ii. ගරු නසීර් අහමඩ් මහතා

8. අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
   ii. ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

9. සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
   ii. ගරු අබ්දුල් හලීම් මහතා

10. කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු වඩිවේල් සුරේෂ් මහතා
   ii. ගරු වේලු කුමාර් මහතා

11. පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු රන්ජන් රාමනායක මහතා
   ii. ගරු කිංස් නෙල්සන් මහතා

12. වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
   ii. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

13. කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
   ii. ගරු ඉෂාක් රහුමාන් මහතා

14. වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු ෆයිසාල් කාසිම් මහතා
   ii. ගරු එම්.එස්. තවුෆික් මහතා

15. ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු ගයන්ත කරුණාතිලක මහතා
   ii. ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා

16. ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු විජිත හේරත් මහතා
   ii. ගරු දිලිප් වෙදආරච්චි මහතා

17. වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු පලනි දිගම්බරම් මහතා
   ii. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

18. ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු රවුෆ් හකීම් මහතා
   ii. ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා

19. විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   i. ගරු එච්.එම්.එම්. හරීස් මහතා
   ii ගරු අලි සබ්රි රහීම් මහතා

20. බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
    i. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
    ii. ගරු හේෂා විතානගේ මහතා
21. වරාය හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
    i. ගරු තිස්ස අත්තනායක මහතා
    ii. ගරු සුජිත් පෙරේරා මහතා
22. මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
    i. ගරු කබීර් හෂීම් මහතා
    ii. ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා
23. ප්‍රවාහන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
    i. ගරු කුමාර වෙල්ගම මහතා
    ii. ගරු අශෝක් අබේසිංහ මහතා
24. තරුණ හා ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
    i. ගරු එස්.එම්. මරික්කාර් මහතා
    ii. ගරු හර්ෂණ රාජකරුණා මහතා
25. සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
    i. ගරු එම්. උදයකුමාර් මහතා
    ii. ගරු ඩයනා ගමගේ මහත්මිය
26. වෙළෙඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
    i. ගරු නිරෝෂන් පෙරේරා මහතා
    ii. ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා
27. කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
    i. ගරු රිසාඩ් බදියුදීන් මහතා
    ii. ගරු චමින්ද විජේසිරි මහතා
28. ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
    i. ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
    ii. ගරු මනූෂ නානායක්කාර මහතා

1. பாதுகாப்பு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i. மாண்புமிகு அநுர திசாநாயக்க
    ii. மாண்புமிகு பீல்ட் மார்ஷல் சரத் பொன்சேகா
2. நிதி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i. மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க
    ii. மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா
3. புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i. மாண்புமிகு புத்திக பத்திரண
    ii. மாண்புமிகு எஸ். எம். எம். முஸ்ஸாரப்
4. நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i. மாண்புமிகு மனோ கணேசன்
    ii. மாண்புமிகு முஜிபுர் ரஹுமான்
5. நீதி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்
    ii. மாண்புமிகு க.வி. விக்னேஸ்வரன்
6. வெளிநாட்டு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i. மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன
    ii. மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்
7. அரசாங்க சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i. மாண்புமிகு ஜே.சீ. அலவத்துவல
    ii. மாண்புமிகு நஸீர் அஹமட்
8. கல்வி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i. மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்
    ii. மாண்புமிகு (கலாநிதி) (திருமதி) ஹரினி அமரசூரிய
9. சுகாதார அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i. மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன
    ii. மாண்புமிகு அப்துல் ஹலீம்
10. தொழில் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i. மாண்புமிகு வடிவேல் சுரேஷ்
    ii. மாண்புமிகு வேலு குமார்
11. சுற்றாடல் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i. மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க
    ii. மாண்புமிகு கிங்ஸ் நெல்சன்
12. வனசீவராசிகள் மற்றும் வனப் பாதுகாப்பு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i. மாண்புமிகு துஷார இந்துனில் அமரசேன
    ii. மாண்புமிகு (திருமதி) ரோஹினீ குமாரி விஜேரத்ன
13. கமத்தொழில் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i. மாண்புமிகு சிவஞானம் சிறீதரன்
    ii. மாண்புமிகு இஷாக் ரஹுமான்
14. நீர்ப்பாசன அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i. மாண்புமிகு பைஸால் காசிம்
    ii. மாண்புமிகு எம். எஸ். தௌபீக்
15. காணி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i. மாண்புமிகு கயந்த கருணாதிலக்க
    ii. மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்
16. கடற்றொழில் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i. மாண்புமிகு விஜித ஹேரத்
    ii. மாண்புமிகு திலிப் வெதஆரச்சி
17. பெருந்தோட்ட அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு
    i. மாண்புமிகு பழனி திகாம்பரம்
    ii. ண்புமிகு ஹெக்டர் அப்புஹாமி
18. நீர்வழங்கல் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

[ගරු කථානායකතුමා ]

i. மாண்புமிகு ரஊப் ஹகீம்

ii. மாண்புமிகு டபிள்யூ.எச்.எம். தர்மசேன

19. மின்சக்தி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

i. மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்

ii. மாண்புமிகு அலி சப்ரி ரஹீம்

20. வலுசக்தி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

i. மாண்புமிகு நலீன் பண்டார ஜயமஹ

ii. மாண்புமிகு ஹேஷா விதானகே

21. துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

i. மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க

ii. மாண்புமிகு சுஜித் பெரேரா

22. நெடுஞ்சாலை அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

i. மாண்புமிகு கபீர் ஹஷீம்

ii. மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்

23. போக்குவரத்து அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

i. மாண்புமிகு குமார வெல்கம

ii. மாண்புமிகு அசோக் அபேசிங்க

24. இளைஞர் மற்றும் விளையாட்டுத்துறை அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

i. மாண்புமிகு எஸ்.எம். மரிக்கார்

ii. மாண்புமிகு ஹர்ஷண ராஜகருணா

25. சுற்றுலாத்துறை அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

i. மாண்புமிகு எம். உதயகுமார்

ii. மாண்புமிகு (திருமதி) டயனா கமகே

26. வர்த்தக அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

i. மாண்புமிகு நிரோஷன் பெரேரா

ii. மாண்புமிகு தருமலிங்கம் சித்தார்தன்

27. கைத்தொழில் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

i. மாண்புமிகு றிஸாட் பதியுதீன்

ii. மாண்புமிகு சமிந்த விஜேசிறி

28. வெகுசன ஊடக அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

i. மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்

ii. மாண்புமிகு மனுஷ நாணாயக்கார

1. Ministerial Consultative Committee on Defence

i. Hon. Anura Dissanayaka

ii. Hon. Field Marshal Sarath Fonseka

2. Ministerial Consultative Committee on Finance

i. Hon. Patali Champika Ranawaka

ii. Hon. (Dr.) Harsha de Silva

3. Ministerial Consultative Committee on Buddhasasana , Religious and Cultural Affairs

i. Hon. Buddhika Pathirana

ii. Hon. S. M. M. Muszhaaraff

4. Ministerial Consultative Committee on Urban Development and Housing

i. Hon. Mano Ganesan

ii. Hon. Mujibur Rahuman

5. Ministerial Consultative Committee on Justice

i. Hon. G. G. Ponnambalam

ii. Hon. C.V. Wigneswaran

6. Ministerial Consultative Committee on Foreign

i. Hon. (Dr.) Kavinda Heshan Jayawardhana

ii. Hon. Shanakiyan Rajaputhiran Rasamanickam

7. Ministerial Consultative Committee on Public Services, Provincial Councils and Local Government

i. Hon. J. C. Alawathuwala

ii. Hon. Naseer Ahamed

8. Ministerial Consultative Committee on Education

i. Hon. Charles Nirmalanathan

ii. Hon. (Dr.) (Ms.) Harini Amarasuriya

9. Ministerial Consultative Committee on Health

i. Hon. (Dr.) Rajitha Senarathne

ii. Hon. Abdul Haleem

10. Ministerial Consultative Committee on Labour

i. Hon. Vadivel Suresh

ii. Hon. Velu Kumar

11. Ministerial Consultative Committee on Environment

i. Hon. Ranjan Ramanayake

ii. Hon. Kins Nelson

12. Ministerial Consultative Committee on Wildlife and Forest Conservation

i. Hon. Thushara Indunil Amarasena

ii. Hon. (Mrs.) Rohini Kumari Wijerathna

13. Ministerial Consultative Committee on Agriculture

i. Hon. Sivagnanam Shritharan

ii. Hon. Ishak Rahuman

14. Ministerial Consultative Committee on Irrigation

i. Hon. Faizal Cassim

ii. Hon. M. S. Thowfeek

15. Ministerial Consultative Committee on Lands

i. Hon. Gayantha Karunatilleka

ii. Hon. Selvam Adaikkalanathan

16. Ministerial Consultative Committee on Fisheries

i. Hon. Vijitha Herath

ii. Hon. Dilip Wedaarachchi

17. Ministerial Consultative Committee on Plantation

i. Hon. Palani Thigambaram

ii. Hon. Hector Appuhamy

18. Ministerial Consultative Committee on Water Supply
    i. Hon. Rauff Hakeem
    ii. Hon. W. H. M. Dharmasena
19. Ministerial Consultative Committee on Power
    i. Hon. H. M. M. Harees
    ii. Hon. Ali Sabri Raheem
20. Ministerial Consultative Committee on Energy
    i. Hon. Nalin Bandara Jayamaha
    ii. Hon. Hesha Withanage
21. Ministerial Consultative Committee on Ports and Shipping
    i. Hon. Tissa Attanayake
    ii. Hon. Sujith Perera
22. Ministerial Consultative Committee on Highways
    i. Hon. Kabir Hashim
    ii. Hon. (Dr.) V. Radhakrishnan
23. Ministerial Consultative Committee on Transport
    i. Hon. Kumara Welgama
    ii. Hon. Ashok Abeysinghe
24. Ministerial Consultative Committee on Youth and Sports
    i. Hon. S. M. Marikkar
    ii. Hon. Harshana Rajakaruna
25. Ministerial Consultative Committee on Tourism
    i. Hon. M. Udayakumar
    ii. Hon. (Mrs.) Diana Gamage
26. Ministerial Consultative Committee on Trade
    i. Hon. Niroshan Perera
    ii. Hon. Dharmalingam Sithadthan
27. Ministerial Consultative Committee on Industries
    i. Hon. Rishad Bathiudeen
    ii. Hon. Chaminda Wijesiri
28. Ministerial Consultative Committee on Mass Media
    i. Hon. Imthiaz Bakeer Markar
    ii. Hon. Manusha Nanayakkara

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම

பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்

MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
( மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2020 සැප්තැම්බර් 25වන සිකුරාදා එනම් අද දින අපර භාග 12.30ට පාර්ලිමේන්තු සංකීර්ණයේ කාරක සභා කාමර අංක 02හිදී පැවැත්වීමට නියමිත බැවින්, එයට පැමිණ සහභාගි වන ලෙස සාමාජික මන්ත්‍රීවරුන් සියලුදෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

I wish to inform all the Members that a Meeting of the Committee on Parliamentary Business will be held today, Friday, 25th September, 2020 at 12.30 p.m. in Committee Room No. 2 of the Parliamentary Complex. All the Members of the Committee are kindly requested to be present at this Meeting.

## මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

நிதி ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை

PERFORMANCE REPORT OF THE FINANCE COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2019 වර්ෂය (2019.01.01 - 2019.12.31) සඳහා මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තා

கணக்காய்வுச் சேவை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கைகள்

PERFORMANCE REPORTS OF THE AUDIT SERVICE COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) සහ 153ඌ ව්‍යවස්ථා ප්‍රකාරව 2019 වර්ෂයේ සිව්වැනි කාර්තුව සඳහා (2019.10.01 - 2019.12.31) සහ 2020 වර්ෂයේ පළමුවැනි කාර්තුව සඳහා (2020.01.01 - 2020.03.31) විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තා මම ඉදිරිපත් කරමි.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

Mr. Speaker, we were informed that the Party Leaders' Meeting is at 11.00 o'clock. It appears from your Announcement that it has been fixed at 12.30 p.m. Today being a Friday, it is a little difficult for Muslim Party Leaders to attend the Meeting.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Oh, I see.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

It is okay that today being an exception, if there is any difficulty. But in future, please do not do that.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Okay. We will take note of that.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3) වගන්තිය සහ 14 වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 අප්‍රේල් 16 දිනැති අංක 2171/5, 2020 මැයි 22 දිනැති අංක 2176/19, 2020 ජූනි 30 දිනැති අංක 2182/10 සහ 2020 ජූලි 16 දිනැති අංක 2184/21 දරන අතිවිශේෂ ගැසට් පත්‍රවල පළ කරන ලද රෙගුලාසි.- [අග්‍රාමාත්‍ය, මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2019 වර්ෂය සඳහා මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ වාරිමාර්ග අංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව.- [ගරු චමල් රාජපක්ෂ මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

(i) 2019 වර්ෂය සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව; සහ

(ii) 2019 වර්ෂය සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව.- [අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2019 වර්ෂය සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව.- [ඉඩම් අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2019 වර්ෂය සඳහා නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නගර සැලසුම් සහ ජල සම්පාදන අංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව.-[ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ජයන්ත සමරවීර මහතා (ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜயந்த சமரவீர - களஞ்சிய வசதிகள், கொள்கலன் முனையங்கள், துறைமுக வழங்கல் வசதிகள், இயந்திரப் படகுகள் மற்றும் கப்பற்றொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Jayantha Samaraweera - State Minister of Warehouse Facilities, Container Yards, Port Supply Facilities and Boats and Shipping Industry Development)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පානදුර, අළුබෝමුල්ල, දිගනතුඩුව, අංක 372 A දරන ස්ථානයෙහි පදිංචි අයි.සී. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) වස්කඩුව, දෙදියවල, අංක 170ඒ දරන ස්ථානයෙහි පදිංචි එස්.එම්.ඩබ්ලිව්. පතිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு சாரதீ துஷ்மந்த)
(The Hon. Sarathi Dushmantha)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අවිස්සාවේල්ල, මාදොල, නිල්මිණි උයන, අංක 162/121/18 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.කේ. ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අවිස්සාවේල්ල, මාදොල, නිල්මිණි උයන, අංක 162/121/18 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.වයි.එස්.කේ. ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)

ගරු කථානායකතුමනි, මම පදියපැලැල්ල, ලඳුපිට, "ආසිරි" යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්.එල්.ඩබ්ලිව්. අනුරුද්ධ ලබුතල මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### පින්නවල අලි අනාථාගාරය: ආදායම/ අලාභය
### பின்னவல யானை சரணாலயம்: வருமானம்/ நட்டம்
### PINNAWALA ELEPHANT ORPHANAGE: INCOME/ LOSS

8/2020

**1.** ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා දෙස් විදෙස් සංචාරකයන් විශාල සංඛ්‍යාවක් පැමිණෙන බවත්;

(ii) එම ආයතනය මඟින් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තුමේන්තුවට වැඩිම ආදායමක් ලබාදෙන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා පැමිණි විදේශීය සංචාරකයන් සංඛ්‍යාව, එක් එක් කාර්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2015 සිට 2019 දක්වා එමඟින් ලැබුණු ආදායම එක් එක් වර්ෂය සහ කාර්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) පින්නවල අලි අනාථාගාරය නැරඹීමට පැමිණෙන සංචාරකයන්ට අලි පැටවුන්ට කිරි පෙවීම සඳහා අවස්ථාවක් ලබා දීම මේ වනවිට නවතා තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) අලි පැටවුන්ට කිරි පෙවීම සඳහා සංචාරකයන්ට අවස්ථාවක් ලබා නොදීම හේතුවෙන් ආයතනය වාර්ෂිකව ලබන අලාභය කොපමණද;

(iv) ශ්‍රී ලංකාවට වටිනා සම්පතක් වන පින්නවල අලි අනාථාගාරය වැඩිදියුණු කිරීම සඳහා රජය මඟින් යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(v) එසේ නම්, එම වැඩ පිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பின்னவல யானை சரணாலயத்தை பார்வையிடுவதற்கு ஏராளமான உள்நாட்டு, வெளிநாட்டு சுற்றுலாப்பயணிகள் வருகை தருகிறார்கள் என்பதையும்;

(ii) இந்த நிறுவனம் தேசிய மிருகக்காட்சிசாலைகள் திணைக்களத்துக்கு கூடிய வருமானத்தை ஈட்டித்தருகின்றது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) 2015 ஆம் ஆண்டு முதல் 2019 ஆம் ஆண்டு வரையில் பின்னவல யானை சரணாலயத்தை பார்வையிடுவதற்காக வருகை தந்துள்ள வெளிநாட்டு சுற்றுலாப்பயணிகளின் எண்ணிக்கை, ஒவ்வொரு காலாண்டு ரீதியாகவும் வெவ்வேறாகவும் யாதென்பதையும்;

(ii) 2015 ஆம் ஆண்டு முதல் 2019 ஆம் ஆண்டு வரையில் இதனால் கிடைக்கப்பெற்றுள்ள வருமானம் ஒவ்வொரு வருடத்துக்கும் காலாண்டு ரீதியாக வெவ்வேறாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) பின்னவல யானை சரணாலயத்தை பார்வையிடுவதற்காக வருகை தரும் உல்லாசப்பயணிகளுக்கு யானைக் குட்டிகளுக்கு பால் ஊட்டுவதற்காக வழங்கப்பட்ட வாய்ப்பு தற்போது நிறுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கான காரணம் யாதென்பதையும்;

(iii) யானைக் குட்டிகளுக்கு பால் ஊட்டுவதற்காக உல்லாசப்பயணிகளுக்கு வாய்ப்பு வழங்காமையினால் நிறுவனத்துக்கு வருடாந்தம் ஏற்படும் நட்டம் யாதென்பதையும்;

(iv) இலங்கைக்கு பெறுமதிமிக்க ஒரு வளமான பின்னவல யானை சரணாலயத்தை மேம்படுத்துவதற்காக அரசாங்கம் ஏதேனும் நடவடிக்கையை மேற்கொள்ளுமா என்பதையும்;

(v) ஆமெனில், குறிப்பிட்ட வேலைத்திட்டம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Tourism:

(a) Is he aware that-

(i) a large number of local and foreign tourists visit the Elephant Orphanage in Pinnawala; and

(ii) a substantial income is generated by the aforesaid institution on behalf of the Department of National Zoological Gardens?

(b) Will he inform this House-

(i) separately, the number of foreign tourists who visited the Elephant Orphanage, Pinnawala from 2015 to 2019 during each quarter; and

(ii) separately, the income generated through the aforesaid visits from 2015 to 2019 based on each year and each quarter?

(c) Will he also inform this House-

(i) whether the opportunity given to the visitors who visit the Elephant Orphanage, Pinnawala to bottle feed the baby elephants has been suspended by now;

[ගරු හේෂා විතානගේ මහතා]

(ii) if so, the reasons for the above decision;

(iii) the annual loss incurred by the institution as a result of not providing the tourists with the opportunity to bottle feed the baby elephants;

(iv) whether a certain programme will be implemented by the Government to develop the Elephant Orphanage, Pinnawala, which is considered one of the most valuable assets in Sri Lanka; and

(v) if so, what the said programme is?

(d) If not, why?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - சுற்றுலாத்துறை அமைச்சர்)
(The Hon. Prasanna Ranatunga - Minister of Tourism)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i)

(ii)

ගරු කථානායකතුමනි, පසුගිය වර්ෂවල සංචාරකයන්ගේ පැමිණීමත් ඒ වාගේම ආදායමත් ක්‍රමානුකූලව අඩු වෙමින් තිබෙනවා. ඒ පිළිබඳව ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මේ වගුවෙන් බලාගන්න පුළුවන්. ඒකට ප්‍රධාන හේතුව වෙලා තිබුණේ මෙයයි. පසුගිය කාලසීමාවේදී හීලෑ අලි අත් අඩංගුවට අරගෙන තමයි පින්නවලට ලබා දීලා තිබුණේ. පින්නවල හිටපු අලින් හා මේ අලින් එකතු වුණාම ඒ අය තුළ තිබුණු හැසිරීම හා තත්ත්වය වෙනස් වීමත් එක්ක පරිපාලන ව්‍යුහය තුළ නොයෙකුත් දේවල් කරලා තිබෙනවා. ඒ තත්ත්වය තුළ නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වුණා. සමහර රාජ්‍ය නොවන සංවිධාන මේ ස්ථානයට විරුද්ධව නඩු පවා දාලා තිබුණා. ගරු කථානායකතුමනි, පසුගිය කාලයේ නොයෙකුත් හේතු නිසා පින්නවල අලි අනාථාගාරය

| කාර්තුව | විදේශීය සංචාරක පැමිණීම - පින්නවල අලි අනාථාගාරය | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
| පළමු කාර්තුව | 110,529 | 125,855 | 108,360 | 110,057 | 92,562 |
| දෙවන කාර්තුව | 63,494 | 63,186 | 63,744 | 61,026 | 24,120 |
| තෙවන කාර්තුව | 95,861 | 97,190 | 84,037 | 80,016 | 27,817 |
| හතරවන කාර්තුව | 92,778 | 94,874 | 83,603 | 86,563 | 53,900 |
| **එකතුව** | **362,662** | **381,105** | **339,744** | **337,662** | **198,399** |

විදේශිකයන්ට blacklist කරන තත්ත්වයට පත් වෙලා තිබුණා.

| කාර්තුව | විදේශීය සංචාරක ආදායම (රු.) පින්නවල අලි අනාථාගාරය | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
| පළමු කාර්තුව | 248,958,850 | 274,463,650 | 234,330,050 | 226,061,050 | 222,577,100 |
| දෙවන කාර්තුව | 127,299,350 | 126,631,150 | 124,846,450 | 109,857,900 | 53,031,400 |
| තෙවන කාර්තුව | 206,620,550 | 205,350,200 | 170,372,250 | 160,668,700 | 58,391,500 |
| හතරවන කාර්තුව | 183,095,000 | 181,803,500 | 154,441,800 | 152,919,900 | 102,803,000 |
| **එකතුව** | **765,973,750** | **788,248,500** | **683,990,550** | **649,507,550** | **436,803,000** |

ඒක නිසා එහි ආදායම් අඩු වෙන්නත්, සංචාරකයන්ගේ පැමිණීම අඩු වෙන්නත් හේතු වෙලා තිබෙනවා කියන එක තමයි සඳහන් කරන්න වන්නේ.

(ඇ) (i) ඔව්.

(ii) 1. කිරි උරා බොන අවස්ථාවේ පසුවන අලි පැටවුන් සහ මවුවරු අතර පවතින අන්‍යෝන්‍ය බැඳීම ඉතාම ශක්තිමත් බැවින්, පින්නවල අලි අනාථාගාරයේ උපත ලබන, මවගෙන් කිරි බොන එම පැටවුන් වෙන්කර මේ සඳහා යොදාගනිමින් එම සතුන්ට කෘත්‍රිමව කිරි පෙවීම සඳහා යොදා ගැනීම උචිත නොවීම.

2. රාජ්‍ය නොවන සංවිධානයක් විසින් අභියාචනාධිකරණයේ ගොනු කරන ලද CA/Writ/370/15 දරන නඩුවේදී සතුන් පුනරුත්ථාපනයට අදාළව ලබාදුන් නියෝග හේතුවෙන් අලි පැටවු ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට නොහැකි වී ඇත.

ගරු කථානායකතුමනි, එතැනත් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ පින්නවල අලි අනාථාගාරයේ සිටිය යුතු අලි ප්‍රමාණයට වඩා අලි විශාල ප්‍රමාණයක් සිටින එකයි. මේක blacklist කරන්න එකත් එක ගැටලුවක් වෙලා තිබෙනවා. ඒ වාගේම, මේ නඩු තීන්දුව නිසා ඉදිරි වැඩ කරගෙන යන්න බැරි තත්ත්වයකුත් උදා වෙලා තිබෙනවා.

(iii) අලි ඇතුන්ට කිරි පෙවීමෙන් 2015 වර්ෂයේ රුපියල් මිලියන 5.9ක් ද, 2017 වර්ෂයේ රුපියල් මිලියන 3.3ක් ද, 2018 වර්ෂයේ රුපියල් මිලියන 3.4ක් ද ආදායම් ලෙස උපයාගෙන ඇත. මෙම වැඩසටහන ක්‍රියාත්මක වූ එම වර්ෂවලදී උපයන ලද ඉහත කී ආදායම් සැලකිල්ලට ගත් කළ ආසන්න වශයෙන් වාර්ෂිකව රුපියල් මිලියන 5ක පමණ අලාභයක් සිදු වේ යැයි නිරීක්ෂණය කරමි.

(iv) ඔව්.

(v) අලි ඇතුන්ගේ සුබ සාධනය සහ රැකවරණය සඳහා

a. අලි ඇතුන්ට ජීවත් වීමට අක්කර 16ක් පමණ වූ ප්‍රදේශයක් වෙන් කර, දම්වැල්වලින් තොරව අලි ඇතුන්ට එම කලාපය තුළ නිදහසේ ජීවත් වීමට සැලසුම් කර ඇත. දැනට එහි ඉදිකිරීම් අවසන් වෙමින් පවතින අතර, එය වෘක්ෂලතා, මඩ පොකුණු, වැලි පොකුණු, අලි ඇතුන්ට ආහාර ලබා ගැනීමට සුදුසු ස්ථාන, පිට කැසීම සඳහා සකස් කරන ලද ස්ථාන ආදියෙන් සමන්විත වේ.

b. අලි ඇතුන් දොළහකට ලැගුම්ගත හැකි වන පරිදි නව අලි පන්තියක් සඳහා සැලසුම් සකස් කරමින් පවතින අතර, තනි අලි සඳහා අලි පන්ති පහක් ඉදිකර අවසන් කර ඇත. පවතින සියලු අලි පන්ති ප්‍රතිසංස්කරණය කරමින් පවතී.

c. අලි අනාථාගාරයේ රැකවරණය ලබන අලි ඇතුන්ට දිය නෑම සඳහා පවතින වැව පුළුල් කරමින් පවතී.

d. පින්නවල අලි අනාථාගාරයට කිලෝමීටර 3ක් පමණ දුරින් පිහිටි අක්කර 17ක් පමණ වූ ඉඩමක් ප්‍රමාණවත් වන්දි මුදල් ලබා ගැනීමෙන් අනතුරුව දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට එහි අයිතිකරු කැමැත්ත ප්‍රකාශ කර ඇත. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ 2වන වගන්තිය යටතේ පවරා ගැනීමෙන් පසු අලි ඇතුන් අභිජනනය සඳහා යොදා ගැනීමට යෝජිතය.

e. අලි අනාථාගාරය වටා පිහිටි පෞද්ගලික ඉඩම් අක්කර පහයි පර්චස් අසූහයක් මෙම දෙපාර්තමේන්තුව වෙත අත් පත් කර ගැනීමට ඉඩම් පවරා ගැනීමේ ක්‍රියාවලියේ විවිධ අදියරවල පවතී. පවරා ගැනීමෙන් අනතුරුව එම භූමි අලි

ඇතුන්ගේ සුබ සාධනයට යොදා ගනී. ප්‍රධාන වශයෙන් මද කිපෙන අලි ඇතුන් නිදහසේ රැඳවීමට ස්ථාන සැකසීමට යෝජිතය.

සංචාරකයන්ගේ පහසුකම් වර්ධනය සඳහා

a. විනෝදාස්වාදය වෙනුවෙන් ඉදි කරන උද්‍යාන තුනක් වෙන් කර ඇත.

b. සංචාරක අවන්හල ඉදි කිරීම් අවසන් වෙමින් පවතී.

c. නැරඹුම් මැදිරිය මහ ජනතාව වෙත විවෘත කර ඇත.

d. මාර්ග පද්ධති - මේ යටතේ පා ගමනින් ගමන් කරන මං මාවත් ඉදිකිරීම් අවසන් වෙමින් පවතී. මගී ගමන් මාර්ග සකස් කරන අතර, බගී රථ මිලදී ගෙන ඇත.

e. ප්‍රමාණවත් පහසුකම් සහිත වැසිකිළි පද්ධති පවතින අතර, සංචාරක අවන්හල සමඟ ද වැසිකිළි පද්ධති දෙකක් ඉදි කෙරේ.

f. නරඹන්නන් වෙනුවෙන් ඉදිකරන නව රථ ගාල් දෙකකි.

අක්කර එකයි පර්චස් 150ක් පමණ වූ එක් රථ ගාලක ඉදිකිරීම් දැනටමත් ආරම්භ කර ඇත. මෙය මෝදරවත්ත රථ ගාල ලෙස හැඳින් වේ.

පින්නවල අලි අනාථාගාරය ඉදිරිපිට නාගරික සංවර්ධන අධිකාරියට අයත් අක්කර තුනයි පර්චස් දහනවයක් පමණ වූ ඉඩම පවරා ගැනීමෙන් අනතුරුව වඩාත් අංගසම්පූර්ණ රථ ගාලක් ඉදිකිරීමට අපේක්ෂිතය. එයට අවන්හලක්, බැංකු පහසුකම්, අලෙවිසැල් ආදිය ද ඇතුළත් වෙයි.

g. නරඹන්නන් සඳහා ප්‍රධාන පිවිසුම් දොරටුව වඩාත් පහසුකම් සහිතව ඉදිකිරීමටත්, එයට සමගාමීව අලි-ඇතුන් පිළිබඳව කෞතුකාගාරයක් ඉදිකිරීමටත් සැලසුම් කර ඇත. දැනට භාවිත කරන දේශීය නරඹන්නන් සඳහා වන ප්‍රවේශ ගොඩනැගිල්ල පිටවීමේ දොරටුව ලෙස නවීකරණය වේ.

යටිතල පහසුකම්

a. වියළි කාලගුණ තත්ත්ව යටතේ අලි අනාථාගාරයේ දෛනික අවශ්‍යතා සඳහා දැනට පවතින ජල සැපයුම් පද්ධතිය ප්‍රමාණවත් නොවන බැවින්, ක්‍රමවත් ජල සැපයුම් පද්ධතියක් ස්ථාපිත කරනු ලබයි. මේ තුළින් අලි මඩු පහසුවෙන් පිරිසිදු කිරීමටත්, අලි-ඇතුන්ගේ දෛනික ජල අවශ්‍යතා සපුරා ගැනීමටත් හැකියාව ලැබේ. තරගකාරි ලංසු කැඳවීමේ ක්‍රමය අනුව මේ වනවිට ලංසු කැඳවා ඇත.

b. අලි අනාථාගාරයේ මං මාවත්, උද්‍යාන ආලෝකවත් කිරීමට පවතින විදුලි සැපයුම ප්‍රමාණවත් නොවන බැවින්, ක්‍රමවත් විදුලි සැපයුම් පද්ධතියක් ස්ථාපිත කිරීමට සැලසුම් සකස් කරමින් පවතී.

c. සූර්ය බල ශක්තියෙන් විදුලිය ලබා ගැනීමේ ව්‍යාපෘතියේ වැඩ නිම කර ඇත.

d. ආරක්ෂක කැමරා පද්ධතියක් ස්ථාපිත කර ඇත.

(ඈ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, අපේ ගරු ඇමතිතුමා සියලු කරුණු කාරණා සහිතව ඉතාම සාර්ථක පිළිතුරක් ලබා දීම ගැන බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. පළමුවන අතුරු ප්‍රශ්නය මා අහනවා.

ගරු කථානායකතුමනි, පින්නවල අලි අනාථාගාරය පිළිබඳව මම මේ ප්‍රශ්නය ඇහුවේ, එය අපේ රටේ ආකර්ෂණීය සංචාරක ස්ථානවලින් ඉතාම ඉහළින්ම තිබෙන තැනක් නිසායි.

ගරු ඇමතිතුමනි, පින්නවල අලි අනාථාගාරයෙන් අපට සෘජුව ලැබෙන ආදායම ගැන තමයි ඔබතුමා කිව්වේ. මීට අමතරව, වක්‍රව විශාල ආදායමක් ලැබෙනවා. සංචාරකයන් නවාතැන් ගන්නා හෝටල් සමූහයක් මේ අවට තිබෙනවා. ඒ සියල්ල අද යම් ප්‍රමාණයකට අඩපණ වීමක් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, සංචාරක ආකර්ෂණය වැඩි වශයෙන් ලබා ගෙන තිබුණේ පොඩි අලි පැටවුන්ට කිරි ලබාදීමට තිබුණු අවස්ථාවත් එක්කයි. ඔබතුමා ඒ ගැන කරුණු කාරණා සහිතව කිව්වා. හැබැයි, ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගේ අවධානයට කාරණයක් යොමු කරනවා. මොකද, අලි පැටවුන්ට කෘත්‍රිමව කිරි පෙවීම නුසුදුසුයි යන්න එක හේතුවක් විධියට ඔබතුමා සඳහන් කළා. නමුත් මම නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ උඩවලව අලි අනාථාගාරයේත් සියලු අලි පැටවුන්ට දෙන්නේ කෘත්‍රිම කිරි. එතැන එහෙම තිබේද්දීත්, මෙතැන මෙහෙම වෙනවා නම්, ඒ වෙනස මොකක්ද කියන එක ඔබතුමා අවබෝධයට ගන්න.

මේ කරුණුත් එක්ක අපට හෙළි වෙන්නේ මේක නතර කරන්න කියන තැනට තල්ලු වෙන එක නේ. නමුත් ඒ දිස්ත්‍රික්කයේ අමාත්‍යවරු, මන්ත්‍රීවරු විශාල පිරිසක් ඉන්නවා. විශේෂයෙන්ම සබරගමු පළාත් සභාව යටතේ, විශාල වශයෙන්ම සංචාරක ආකර්ෂණ ප්‍රදේශ අතරින් ඉහළින්ම තිබෙන තැනක් විධියට මේ පින්නවල අලි අනාථාගාරය හඳුන්වන්න පුළුවන්. ඔය කියන කාරණාවේ යම්කිසි නිදොස් කළ යුතු තැන් තිබෙනවා නම්, ඒවා නිදොස් කරලා එතැනටම ආ සංචාරකයන්ගේ බලාපොරොත්තු ඉදිරියේදී ඉෂ්ට කරන්නට කටයුතු කරන්න ඕනෑ.

සංචාරක ආකර්ෂණීය ප්‍රදේශ තවදුරටත් ව්‍යාප්ත කිරීමට පසුගිය රජය ගත්ත ක්‍රියාමාර්ග ටිකක් ගැනත් ඔබතුමාගෙන් කියැවුණා. ඔබතුමාත් ඒ කාරණා පිළිගන්නවා ඇති. මේ ස්ථානය රටට අවශ්‍ය සංචාරක ආකර්ෂණීය ස්ථානයක් වන නිසා, සංචාරක අමාත්‍යවරයා විධියට ඔබතුමා දේශපාලනයෙන් ඔබ්බට ගිහිල්ලා ඒ ක්‍රියා මාර්ග තවදුරටත් ඉදිරියට ගෙන යන්න අවශ්‍ය කටයුතු කරයි කියා මා විශ්වාස කරනවා. විශේෂයෙන්ම වෙනත් දිස්ත්‍රික්කවල, වෙනත් තැන්වල දකින්න ලැබෙන්නේ නැති සම්පතක් වැඩිදියුණු කරලා, සංචාරකයන්ගේ අවශ්‍යතා වෙනුවෙන් නව ක්‍රමවේදයකට ඒ ක්‍රියා මාර්ගය ගැනීමට බලාපොරොත්තුවක් තිබෙනවාද, එහෙම නැතිනම් ඒ විධියටම එය අතහැර දමනවාද කියා දැනගන්න මා කැමැතියි.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, මේ විෂය, වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයත් සමඟට එකට යා යුතු බවයි මා විශ්වාස කරන්නේ. ඒ පිළිබඳව අපි ජනාධිපතිතුමා දැනුවත් කරගෙන තිබෙනවා. මම සතුන්ට ආදරය කරන පුද්ගලයකු හැටියටත්, සංචාරක විෂය භාර ඇමතිවරයා හැටියටත්, සතුන්ට හිරිහැරයක් නොවන ආකාරයට, සතුන්ගේ අයිතිවාසිකම් රැකෙන පරිදි මේ කටයුත්ත කරන්න ඕනෑය කියන මතයේ ඉන්නවා. අද මේ වෙනකොට පින්නවල අලි අනාථාගාරය blacklist කරලා, සංචාරකයන්ට එන්න එපා කියන තත්ත්වයට පත් කරලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියනවා වාගේ උඩවලවේ වෙනම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. මේ විෂයන් දෙක අමාත්‍යවරු දෙදෙනෙක් අතර තිබෙන්නේ. අපට නඩුත් දමා තිබෙනවා. ඒ කියන්නේ, පසුගිය රජය කාලයේ හීලෑ ඇතුන් අරගෙන පින්නවලට දැමීම නිසා ඇති වුණු තත්ත්වයක් එක්ක මේ

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

අලින් ඒ ස්ථානයට ගෙන යන්න බැරි තත්ත්වයකුත් උදා වෙලා තිබෙනවා. මෙහි පරිපාලන ගැටලුවක් තිබෙන්නේ. ඒ නිසා මේ සම්බන්ධව වන ජීවී හා වන සංරක්ෂණ ඇමතිතුමාත්, ඒ වාගේම සතුන් පිළිබඳව නිපුණතාවක් තිබෙන අයත් ගෙන්වා, ඒ අයගෙනුත් අදහස් අරගෙන ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරනවා වාගේම, ඒ සතුන්ගේ සුරක්ෂිතතාව රැකෙන පරිදි කටයුතු කරන්නටත් අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

සත්ව අයිතීන් ද රැකගෙන මේ කටයුතු කරන්න ඕනෑ කියලා ඔබතුමා කිව්වා. ඒක හොඳ කාරණාවක්. හැබැයි, ඔබතුමන්ලා ඒක යෝජනාවක් වශයෙන් ගෙනාවාට බිමේදී ඒක දකින්න නැහැ. අපි දැක්කා, පසුගිය දවස්වල ගව ඝාතනය සම්පූර්ණයෙන් නතර කර දානවා කියලා කැබිනට් එකට යෝජනාවක් ගෙනැල්ලා තිබුණු බව. එම යෝජනාව පාර්ලිමේන්තුවට ගෙනාවේ නැතත්, පාර්ලිමේන්තුවේදී ඒ පිළිබඳ අදහස් හුවමාරු වුණා. ඒ වාගේම, මම මේ වෙලාවේ අපේ ගරු ඇමතිතුමාගේ අවධානය පිණිස කාරණයක් මතු කරනවා. මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ ගරු මුදිතා ප්‍රිශාන්ති මන්ත්‍රීතුමියත් මෙතැන ඉන්නවා. පසුගිය කාලයේ - ඔබතුමන්ලාගේ පාලන කාලයේ- ප්‍රසිද්ධ දේශපාලනඥයකුගේ මන දොළ පිනවන්න ගල්පාය ප්‍රදේශයේදී උඩවලව කැලයෙන් අලි පැටවකු බලෙන් අල්ලාගෙන යන්න ගිහින්, අන්තිමේදී ඒ සිද්ධිය ආවරණ කරන්න ගිය මාධ්‍යවේදීන්ගේ කැමරා පවා කුඩු කරලා තිබුණා. මහින්ද තේරසිංහ කියන මාධ්‍යවේදියාගේ කැමරාව කුඩු කරලා තිබුණා. රජය මැදිහත් වෙලා ඔහුට සාධාරණය ඉටු කළා.

ගරු අමාත්‍යතුමනි, මගේ මේ කාරණය ඔබතුමා කියූ කාරණාවත් එක්ක අමුණන්න හේතුවක් තිබෙනවා. සංචාරකයන් මේ රටට ගෙන එන එක අපේ අවශ්‍යතාව නම්, අනෙක් සියලු දේට කන් දෙනවා වාගේම, අපි ඒ කෙරෙත් අවධානය යොමු කරන්න ඕනෑ. උඩවලව ප්‍රදේශයේ මුළු ආර්ථිකයම රැඳී තිබෙන්නේ ඔය අලි අනාථාගාරය මතයි, ගරු ඇමතිතුමනි. සංචාරක ආකර්ෂණය සහ ජන ජීවිතය නංවන්න රජයේ වැඩසටහන් තිබෙනවා නම්, මා කියන කාරණාවත් ඊට ඇතුළත් කරගන්න. ඔබතුමා කියන කාරණා සිල්ලර කාරණා විධියට පැත්තකට දාන්න බැහැ කියලා අපි දන්නවා. නමුත්, ඒ කාරණාවලට ඇහුම් කන් දෙන ගමන් රජය හරක් මරණ එක නවත්වන්න ගත් තීන්දුව වාගේ ඍජු තීන්දු අරගෙන මා කී කාරණයට අදාළ කටයුත්තත් ඉදිරියට කරගෙන යෑම රටේ ජන ජීවිතයට, රටේ ආර්ථිකයට, විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනයට හේතු වනවා නේද, එහෙම නැතිව කාගේ හරි හුදු බලපෑමකට, එක කොළ කැල්ලක් දාපු පළියට එය ආපස්සට ගන්න ගියොත්, ඔබතුමාත් අපත් බලාපොරොත්තු වන සංචාරක ක්ෂේත්‍රය ඉහළට ගෙන යෑම කියන අරමුණ ඉටු කරගන්න බැරි වෙනවා නේද කියන ප්‍රශ්නවලට පිළිතුරු ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, මගේ උත්තරයේදී පැහැදිලිව කිව්වා, අපි කිසිම අවස්ථාවක පින්නවල අලි අනාථාගාරය වහන්නවත්, ඒක ආපස්සට ගන්නවත් කටයුතු කරන්නේ නැහැ කියලා. එය සංවර්ධනය කිරීමට විධිමත් විධියට කටයුතු කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේම අපේ රටේ ඉතිහාසයේ සංස්කෘතිකමය කටයුතු වෙනුවෙන් යොදාගැනීම සඳහා පන්සල්වල හීලෑ අලි ඇතුන් සිටියා; ඒ අලි ඇතුන් පෙරහැරවල අරගෙන ගියා. අපි අහලා තිබෙනවා, අපේ ඉතිහාසයේ -රජ කාලේ ඉඳන්- අලි ඇතුන් එවැනි දේට යොදවා තිබෙනවා කියලා. නමුත්, පසුගිය රජය දේශපාලන පළිගැනීම් කරන්න බලාගෙන අලි ඇතුන් අත් අඩංගුවට අරගෙන පින්නවලට දැමීම නිසා එහි පරිපාලන ගැටලු මතු වෙලා තිබෙනවා. සතුන්ට ආදරය කරන කෙනෙකු හැටියට මම කිව්වා, සතුන්ගේ අයිතිවාසිකම් රැකෙන විධියට සංවර්ධන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරන බව.

ගරු කථානායකතුමනි, උදාහරණයක් විධියට දෙහිවල සතුන්වත්ත ගනිමු. එහි සතුන් හිර කරලා තබන ක්‍රමවේදයයි තිබෙන්නේ. එය දැන් යල් පැන ගිය ක්‍රමයක්. නමුත්, සෆාරි උද්‍යාන ක්‍රමවේදය බෙහෙවින් සාර්ථක වෙලා තිබෙනවා. හම්බන්තොට, රිදියගම සෆාරි උද්‍යානය ඊට හොඳම නිදසුනයි. ඒ ආකාරයට අලුත් විධියට හිතලා අපට කටයුතු කරන්න වෙනවා. මේ පිළිබඳ අපට තීන්දු ගන්න බැහැ, ගරු කථානායකතුමනි. සතුන් පිළිබඳ හොඳ අවබෝධයක් තිබෙන කණ්ඩායමක් කමිටුවක් හැටියට පත් කරලා ඒ අයගෙනුත් උපදෙස් අරගෙන තමයි මේ කටයුත්ත කරන්න වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -52/2020- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, කම්කරු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -95/2020- (1), ගරු බුද්ධික පතිරණ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -117/2020- (1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -121/2020- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සාස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -127/2020- (1), ගරු චාල්ස් නිර්මලනාදන් මහතා.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 -159/2020- (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා.
*[සභා ගර්භය තුළ නැත.]*

## 2015-2019 දක්වා ඇලුමිනියම් ආනයනය: විස්තර
## 2015 - 2019 வரையான காலப்பகுதியில் அலுமினிய இறக்குமதி: விபரம்
IMPORT OF ALUMINIUM FROM 2015-2019: DETAILS

211/2020

**8. ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ -
  (i) ශ්‍රී ලංකාවට ආනයනය කළ ඇලුමිනියම් ප්‍රමාණය;
  (ii) ඒ සඳහා වැය වූ මුදල;
  (iii) එම ඇලුමිනියම් ආනයනය කළ රටවල්;
  (iv) එම ඇලුමිනියම් ආනයනය කළ සමාගම්වල නම්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ඇලුමිනියම් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் நிதி அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) 2015 ஆம் ஆண்டு தொடக்கம் 2019 ஆம் ஆண்டு வரையிலான ஒவ்வொரு வருடத்திலும் -
  (i) இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட அலுமினியத்தின் அளவு யாதென்பதையும்;
  (ii) அதற்காகச் செலவு செய்யப்பட்ட தொகை எவ்வளவென்பதையும்;
  (iii) மேற்படி அலுமினியம் எந்தெந்த நாடுகளிலிருந்து இறக்குமதி செய்யப்பட்டது என்பதையும்;
  (iv) மேற்படி அலுமினியத்தினை இறக்குமதி செய்த கம்பெனிகள் யாவையென்பதையும்;

தனித்தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி காலப்பகுதியில் இலங்கைக்கு அலுமினியம் இறக்குமதி செய்வதற்காகச் செலவாகிய மொத்தத் தொகை எவ்வளவென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Finance, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing:

(a) Will he inform the House, pertaining to each of the years during the period from 2015 to 2019, of-
  (i) the volume of aluminium imported into Sri Lanka;
  (ii) the amount of money it cost;

[ගරු මොහමඩ් මුසම්මිල් මහතා]

(iii) the countries from which aluminium was imported; and

(iv) the names of the companies which imported aluminium ?

(b) Will he also inform the House of the total expenditure of importing aluminium into Sri Lanka during the period concerned?

(c) If not, why?

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා (මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால் - நிதி, மூலதனச் சந்தை மற்றும் அரச தொழில்முயற்சி மறுசீரமைப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Nivard Cabraal - State Minister of Money and Capital Market and State Enterprise Reforms)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) පිළිතුර ඇමුණුම 01හි දක්වා ඇත.

(ii) පිළිතුර ඇමුණුම 02හි දක්වා ඇත.

(iii) පිළිතුර ඇමුණුම 03හි දක්වා ඇත.

(iv) පිළිතුර ඇමුණුම 04හි දක්වා ඇත.

ඇමුණුම් 01, 02, 03 සහ 04 **සභාගත*** කරනවා.

(ආ) රුපියල් 95,723,663,642.62යි. (රුපියල් මිලියන 95,723)

(ඇ) පැන නොනඟී.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)

ගරු කථානායකතුමනි, පළමුවෙනි අතුරු ප්‍රශ්නය මම අහනවා.

ගරු ඇමතිතුමනි, මෙම ඇලුමිනියම් ආනයනය කිරීමේදී බොහෝ වෙලාවට මේවා අගය එකතු කරපු නිෂ්පාදන විධියට තමයි ආනයනය කරන්නේ. ඒ සඳහා විකල්ප වශයෙන් අපට දැනට දේශීය නිෂ්පාදනත් යොදා ගැනීමට හැකියාව තිබෙනවා. ඒ හරහා ජනාධිපතිතුමා අලුතින් විවිධ අමාත්‍යාංශ නම් කරලා තිබෙනවා. ලංකාවට ඇලුමිනියම් නැත්නම් ඒවා ආනයනය කිරීමෙන් පසුව අගය එකතු කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීමටත්, එහෙම නැත්නම් ඒකට විකල්ප වශයෙන් පාවිච්චි කරන දේවල් ප්‍රවර්ධනය කිරීම සඳහාත් යම් වැඩ පිළිවෙළක් තිබෙනවාද?

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)

ඉතාම වැදගත් අදහසක්. අපි ඒ අනුව කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. මම ඒ පිළිබඳ ඉදිරි අනාගතයේදී අතිගරු ජනාධිපතිතුමා සමඟත්, අපේ අගමැතිතුමා සමඟත් සාකච්ඡා කරලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහනවා.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන් විවිධ ඉවත ලන ද්‍රව්‍ය විවිධාකාරයෙන් අබලි ද්‍රව්‍ය ලෙස ඒකරාශී වීම සිද්ධ වෙනවා. මෙම අබලි ද්‍රව්‍ය විවිධ ක්‍රම හරහා අපනයනය කිරීම සිද්ධ වෙනවා. දේශීය ව්‍යාපාරිකයන් වශයෙන් ව්‍යවසායකයන් මුහුණ දෙන ගැටලුවක් තමයි අමුද්‍රව්‍ය නොමැතිකම. මේවා අමුද්‍රව්‍ය වශයෙන් ඔවුන්ගේ නිෂ්පාදන සඳහා යොදා ගැනීමට ඔවුන්ට හැකියාව තිබෙනවා නම් ඒක අතිශයින්ම වැදගත්. අබලි ද්‍රව්‍ය අපනයනය කිරීම වෙනුවට ඒවා දේශීය ව්‍යවසායකයන්ට ලබා දීමේ යම් ක්‍රමවේදයක් අනුගමනය කරන්න අමාත්‍යාංශය සූදානම් ද කියලා මම අහන්න කැමතියි.

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)

ගරු කථානායකතුමනි, ඒකත් හොඳ අදහසක්. අපට ඉදිරියේදී රාමුවෙන් පිටතට හිතලා යම් ආර්ථිකමය තීරණ ගන්න සිදු වෙනවා. මෙයත් ඉතා වැදගත් යෝජනාවක් හැටියටයි මා දකින්නේ. ඒ අනුව කටයුතු කරන්නට අපි සැලකිලිමත් වනවාය කියන එකත් මේ ගරු සභාවට මා මතක් කර දෙන්න ඕනෑ. [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - வர்த்தக அமைச்சர்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Trade)

ගරු කථානායකතුමනි, විෂයානුබද්ධ ප්‍රශ්න යොමු කිරීමේදී, ඒ විෂයය ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශයට අපේ පාර්ලිමේන්තුවේ මහ ලේකම් කාර්යාලයෙන් යොමු කළොත් හොඳයි කියා මා යෝජනා කරනවා. මක්නිසාදයත්, දැන් වෙළෙඳ අමාත්‍යාංශය කිව්වාම, වෙළෙඳ අමාත්‍යාංශයට අයිති වෙන්නේ ආනයන වෙළෙඳාම, අපනයන වෙළෙඳාම, සිල්ලර වෙළෙඳාම හා තොග වෙළෙඳාම කියන විෂයය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රශ්න. කෘෂිකර්ම අමාත්‍යාංශයට අයිති වෙන්නේ, කෘෂිකර්මය පිළිබඳ ප්‍රශ්න. මහ ලේකම් කාර්යාලයෙන් ඒ ඒ ප්‍රශ්නය අදාළ අමාත්‍යාංශයට යොමු කරනවා නම් හොඳයි.

ගරු කථානායකතුමනි, පසුගිය කාලයේ තඹ හා අබලි ද්‍රව්‍ය ආනයනය සම්බන්ධයෙන් විශාල ජාවාරමක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ ජාවාරම පිළිබඳ විවිධ දේ හෙළිදරවු කර ගන්න බැරි වනවා, අදාළ නොවන අමාත්‍යාංශයකට ප්‍රශ්නය යොමු කළාම. ඒ නිසා ඔබතුමා මහ ලේකම් කාර්යාලයට උපදෙස් දීම වැදගත් වනවා, විෂයය ක්ෂේත්‍රය අයත් වන අමාත්‍යාංශයටම අදාළ ප්‍රශ්නය යොමු කරන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ප්‍රශ්න අංක 9 - 250/2020 - (1), ගරු වේලු කුමාර් මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 - 303/2020 - (1), ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මං එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 - 344/2020 - (1), ගරු මයන්ත දිසානායක මහතා.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, වැවිලි අමාත්‍යතුමා වෙනුවෙන් මං එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වී ඔය ජලාශය ඉදි කිරීම: අවතැන් වන පවුල්
## 'வீ ஓயா' நீர்த்தேக்க நிர்மாணம்: இடம்பெயர நேரிடும் குடும்பங்கள்
## CONSTRUCTION OF WEE OYA TANK: DISPLACED FAMILIES

417/2020

**12.ගරු සුජිත් පෙරේරා මහතා**
(மாண்புமிகு சுஜித் பெரேரா)
(The Hon. Sujith Perera)
වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ, යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වී ඔය නමින් ජලාශයක් ඉදි කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම ජලාශය ඉදි කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ජලාශය ඉදි කිරීමෙන් අවතැන් වන පවුල් සංඛ්‍යාව;

(ii) එම අවතැන් වන පවුල් නැවත පදිංචි කිරීමට ගනු ලබන පියවර;

(iii) මෙම ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන්වන පුද්ගලයන්ගේ නිවාසවලට හා ඉඩම්වලට වන්දි ලබා දෙන ක්‍රමවේදය;

(iv) එම අවතැන් වන ජනතාව සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கேகாலை மாவட்டத்தின் யடியந்தோட்டை பிரதேச செயலகப் பிரிவில் 'வீ ஓயா' என்ற பெயரில் நீர்த்தேக்கம் ஒன்றை நிர்மாணிப்பதற்கு திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அந்த நீர்த்தேக்கத்தை நிர்மாணிப்பதன் நோக்கங்கள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி நீர்த்தேக்கத்தை நிர்மாணித்தால் இடம்பெயர நேரிடும் குடும்பங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அவ்வாறு இடம்பெயரும் குடும்பங்களை மீளக்குடியமர்த்த எடுக்கும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

(iii) இக்கருத்திட்டம் காரணமாக இடம்பெயரும் நபர்களின் வீடுகள் மற்றும் காணிகளுக்கு இழப்பீடு வழங்கும் முறைமை யாதென்பதையும்;

(iv) இடம்பெயரும் அம்மக்கள் தொடர்பாக எடுக்கும் எதிர்கால நடவடிக்கைகள் யாவையெனவும்;

அவர் மேலும் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation:

(a) Will he inform this House-

(i) whether there are plans to construct a tank called ‘Wee Oya’ in Yatiyanthota Divisional Secretary's Division of Kegalle District; and

(ii) if so, the objectives of constructing the said tank?

(b) Will he also inform this House-

(i) the number of families who will be displaced due to the construction of the tank;

[ගරු සුජිත් පෙරේරා මහතා]

(ii) the measure that will be taken to resettle the displaced families;

(iii) the mechanism that will be followed to compensate persons displaced due to the project, for their houses and lands; and

(iv) the future measures that will be taken with regard to people who will be displaced?

(c) If not, why?

**ගරු චමල් රාජපක්ෂ මහතා (වාරිමාර්ග අමාත්‍ය සහ අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - நீர்ப்பாசன அமைச்சரும் உள்ளகப் பாதுகாப்பு, உள்நாட்டலுவல்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சரும்)
(The Hon. Chamal Rajapaksa - Minister of Irrigation and State Minister of Internal Security, Home Affairs and Disaster Management)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කෑගලු දිස්ත්‍රික්කයේ යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වී ඔය නම් ජලාශය ඉදි කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනය සිදු කරමින් පවතී.

(ii) එම ජලාශය බහු කාර්ය ජලාශයක් ලෙස සැලසුම් කර ඇති අතර, එමඟින් පහළ ගංගා ද්‍රෝණියේ ගංවතුර පාලනයත්, කැලණි සහ අත්තනගලු ද්‍රෝණි (කෑගල්ල, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක) සඳහා පානීය ජලය සැපයීමටත්, ජල විදුලි බලය නිපදවීමටත් අපේක්ෂා කරනු ලබයි.

(ආ) (i) මෙම ජලාශය සඳහා වන ශක්‍යතා අධ්‍යයනයේදී සිදු කරනු ලබන සමාජීය සමීක්ෂණය අවසන් වන තෙක් අවතැන් වන පවුල් සංඛ්‍යාව නිශ්චිත වශයෙන් සඳහන් කළ නොහැක.

(ii) තවම ශක්‍යතා අධ්‍යයන මට්ටමේ වන බැවින් නැවත පදිංචි කිරීම සඳහා වන පියවර ගෙන නොමැත.

(iii) වන්දි ලබා දෙන ක්‍රමවේද තවම තීරණය කර නැත.

(iv) තවම අධ්‍යයන මට්ටමේ වන බැවින් මෙම ජලාශය සම්බන්ධයෙන් කිසිම තීරණයක් ගෙන නොමැත.

(ඇ) මෙම ජලාශය සඳහා වන ශක්‍යතා අධ්‍යයනය අවසානයේ දී සිදු කරනු ලබන පාරිසරික බලපෑම් ඇගයීමේ අධ්‍යයනවල දී (EIA) ඉහත කරුණු පිළිබඳ ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද යන්න ඉදිරිපත් කරනු ඇත.

ගරු මන්ත්‍රීතුමාට ඕනෑ නම් ඒ පිළිබඳ අවශ්‍ය සිතියම් ආදිය තිබෙනවා, දෙන්න පුළුවන්.

**ගරු සුජිත් පෙරේරා මහතා**
(மாண்புமிகு சுஜித் பெரேரா)
(The Hon. Sujith Perera)
ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ සම්බන්ධයෙන් ශක්‍යතා වාර්තා පවත්වාගෙන ගෙන යනවා. ප්‍රදේශවාසීන් මේ සම්බන්ධයෙන් නිසියාකාරව දැනුවත් වීමක් සිදු වෙලා නැහැ. ඒ වාගේම, මේක බහුකාර්ය යෝජනා ක්‍රමයක් හැටියට යෝජනා වෙලා තිබෙන නිසා ප්‍රදේශවාසීන් දැන ගන්න කැමැතියි, මේ සඳහා වන්දි ලබා දීමේ ක්‍රමවේදය මොකක්ද කියලා. අපි දන්නවා බහුකාර්ය යෝජනා ක්‍රම සඳහා විශේෂ වන්දි ලබා දීමේ ක්‍රමවේදයක් තිබෙන බව. ඒ ක්‍රමය අනුව ඒ අයට වන්දි ලබා දීමට කටයුතු කරනවාද කියලා මට දැන ගන්න පුළුවන් වේවිද?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
හොඳයි. ඒ කටයුතු සිදු කරගෙන යන විට දැනුම් දෙන්නම්. කොහොමත් ඒ ජනතාව දැනුවත් කරනවා.

**ගරු සුජිත් පෙරේරා මහතා**
(மாண்புமிகு சுஜித் பெரேரா)
(The Hon. Sujith Perera)
ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා අහනවා.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු කථානායකතුමනි, මෙය ලෝක බැංකුව අනුග්‍රහය දක්වන දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය - CRIP - යටතේ, වාරිමාර්ග සහ ජල කළමනාකරණ අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක කරන වැඩසටහනක්. දේශගුණික විපර්යාස නිසා සිදු වන ගංවතුර සහ නියං තත්ත්ව හේතුවෙන් ඇති වන දේපළ හා ජීවිත හානි අවම කිරීම සඳහා වන ඉහත ව්‍යාපෘතිය යටතේ, ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්කයට කැලණි ගඟ හේතුවෙන් සිදු වන හානි අවම කිරීම සඳහායි මෙම වැඩසටහන කරන්නේ. හැබැයි, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී කෑගල්ල දිස්ත්‍රික්කයේ වී ඔය, රුකාසල්, හොලොම්බුව, නාවත කියන ප්‍රදේශ හතරකට ජල කළමනාකරණය පිළිබඳ ගැටලු බලපානවා.

අපේ රජය පැවති 2018-2019 කාලයේත් මේ ව්‍යාපෘති සැලැස්ම අනුව ශක්‍යතා වාර්තා කර ගෙන යද්දි හොලොම්බුව ප්‍රදේශයේ ජීවත් වන විශාල පිරිසකගේ දේපළ ආදී දේවලට හානි වන නිසාත්, එම ජනතාව අවතැන් වන නිසාත් මේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලොකු විරෝධයක් ඇති වුණා. එම නිසා එවකට විපක්ෂයේ සිටි කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරු ඒ ප්‍රදේශයේ ජනතාව පුත්තලමට ගෙනයනවා කියලා භය කරමින් ඒ ප්‍රදේශයේ මිනිසුන්ට බොරු පණිවුඩ දීලා ලොකු සද්දයක් කරලා දේශපාලන සටනක් කළා. හැබැයි, ඒ වෙලාවේදී සුජිත් පෙරේරා මන්ත්‍රීතුමාත්, මාත් මේ ප්‍රශ්නයට මැදිහත් වෙලා මේ තුළින් ඒ ප්‍රදේශයේ ජනතාවට හානියක් වන නිසා අපේ රජයත් එක්ක කථා කරලා එවකට විෂය භාර අමාත්‍යවරයා වූ හැරිසන් ඇමතිතුමාට කියලා ඒ ප්‍රදේශයේ ජීවත් වන ජනතාව වෙනුවෙන් හොලොම්බුව ප්‍රදේශය ආශ්‍රිතව ඒ ව්‍යාපෘතිය කරන්න එපා කියලා අපි ව්‍යාපෘතිය නැවැත්වූවා.

ඇමතිතුමනි, කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන ආණ්ඩුවේ එක ඇමතිවරයෙකුවත් මේ සම්බන්ධයෙන් කථා නොකිරීම ගැන මා කනගාටු වෙනවා. වී ඔය ආශ්‍රිතව සිටින දුප්පත් අහිංසක ගම්මුන්ට ඔවුන්ගේ දේපළ හානි වන ආකාරයවත්, ඔවුන් අවතැන් වනවා නම් මොකක්ද කරන්නේ කියලාවත් අද වන තෙක් කියලා නැහැ. හැබැයි, නිලධාරින් දැන් ඒ ප්‍රදේශයට ගිහිල්ලා ඉඩම්වල මිනුම් කටයුතු කරනවා. මේක එම ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ හිතට ලොකු සැකයක් ගෙන දෙන ප්‍රශ්නයක්. ඒක අසාධාරණයි. මේ සම්බන්ධයෙන් මා යෝජනාවක් කරන්න කැමැතියි.

ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් දිසාපතිවරයාට කියලා ඔබතුමාගේ අමාත්‍යාංශයේ සිටින මීට අදාළ නිලධාරින්ටත්, ගම්මුන්ටත් එන්න කියලා කෑගල්ලේ දී මේ ගැන සාකච්ඡාවක් නොකරන්නේ ඇයි? එම ව්‍යාපෘතියෙන් වෙන දේ මොකක්ද, කොපමණ ඉඩම් ප්‍රමාණයක් මේ නිසා යට වෙන්න ඉඩ තිබෙනවාද කියන දේවල් කථා කරලා මේ සම්බන්ධයෙන් ගම්මුන් දැනුවත් නොකරන්නේ ඇයි? එම දිස්ත්‍රික්කය නියෝජනය කරන මහජන නියෝජිතයන් හැටියට අපට වග කීමක් තිබෙනවා, ඒ මිනිසුන්ගේ අයිතිය රැක දෙන්න. ඇමතිතුමනි, එම නිසා දිසාපති කාර්යාලයේ හෝ ඒ ප්‍රදේශයේම කිසියම් ස්ථානයක වහාම ඒ වාගේ සාකච්ඡාවකට අවස්ථාව ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. සුජිත් සංජීය පෙරේරා මන්ත්‍රීතුමා ඒ ආසනය නියෝජනය කරනවා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
බොහොම ස්තුතියි.

මේ ව්‍යාපෘතිය 1960 දශකයේ සිටම එන එකක්. මා හිතන විදියට ස්ථාන හතරක එවැනි ව්‍යාපෘති ආරම්භ කරන්න සූදානම් වෙලා සිටියා. නමුත්, දැන් මේ නිලධාරින් අධ්‍යයනය කරන්නේ ඒ ස්ථාන හතරෙන් දෙකක් සම්බන්ධයෙන් පමණයි. ඔබතුමා කියපු පරිදි මීට ප්‍රථමත් දැදුරු ඔය, රඹකැන් ඔය වාගේ ජලාශ ආශ්‍රිතව මේ වාගේ කටයුතු වනකොට මම පෞද්ගලිකවම සොයා බැලුවා. ඒ මූලික සැලසුම් අනුව තමුන්නාන්සේ නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ මේ ජලාශය ඉදිවන ස්ථානයක් තිබෙනවා. යටියන්තොට සිට ඌරුගල දක්වා වූ මාර්ගයේ මලල්පොල යන ස්ථානයේ කැලණි ගඟේ අතු ගංගාවක් වන වී ඔය හරහා මේ ජලාශ බැම්ම ඉදිකරන්න යෝජනා කර තිබෙනවා. මේ ව්‍යාපෘතියෙන් යම් බලපෑමක් වනවා නම්, ඒ සම්බන්ධයෙන් ඒ ප්‍රදේශයේ ජනතාවත් දැනුවත් කරනවා; මහජන නියෝජිතයිනුත් දැනුවත් කරනවා. එම ස්ථානයට ගිහිල්ලා සොයා බලා සහයෝගයෙන් අපි ඒ කටයුතු කරමු. පරමාර්ථය සහ අරමුණ පිරිසිදු නම් -හොඳ නම්- ජනතාව දැනුවත් කරලා, ජනතාවට අසාධාරණයක් සිදු නොවන විදියට ඒ අයට අවශ්‍ය වන්දි ලබා දෙන්න, ඒ වාගේම ඉඩම් ලබා දෙන්නේ කොහෙන්ද කියලා හඳුනාගෙන ඒ වැඩ කටයුතු කරන්නත් අපි සූදානම්.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
එම සාකච්ඡාව අපට ලබා දෙනවාද, ගරු රාජ්‍ය ඇමතිතුමනි?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ඔව්.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
හොඳයි. මොකද, අපි කලින් හොලොම්බුව ප්‍රදේශයේ සිදු කළ වැඩේ නතර කළා. ගම්පහ, කොළඹ අයගේ දේපළ හානිය වළක්වන්න කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ ඉඩම් යට වීමට ඉඩ දෙන්න අපට බැහැ. ඒ නිසා අපේ අයිතිය රැක ගැනීම සඳහා ඒ අවස්ථාව අපට ලබා දෙන්න. ඒ සාකච්ඡාව ලබා දුන්නාම ගම්මුන් එක්ක කථා කරලා අපට තීරණයක් ගන්න පුළුවන්, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
මුලින්ම කරපු ශක්‍යතා අධ්‍යයනයට අනුව නම් ඉඩම් හෙක්ටෙයාර 160ක් පමණ යට වනවා කියලා තිබෙනවා. ඒ ඉඩම් අතර කුඹුරු හා රබර් වතුත් තිබෙනවා. මේ හානි අවම කර ගනිමින් වඩාත් ඵලදායී හා සියලුදෙනා සතුටු වන ආකාරයට ඉදිරියේ දී වැඩ කටයුතු කරන්න කථා කර ගනිමු.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ඔබතුමා අපට ඒ අවස්ථාව උදා කර දෙයි කියන දැඩි විශ්වාසය අප තුළ තිබෙනවා. ස්තුතියි.

## වෛද්‍ය සාෆිට එරෙහි පරීක්ෂණ: ප්‍රගතිය
### டாக்டர் சாபிக்கு எதிரான விசாரணைகள்: முன்னேற்றம்
### INVESTIGATIONS AGAINST DR. SAFI: PROGRESS

57/2020

**13.ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) කුරුණෑගල ශික්ෂණ රෝහලේ සේවය කළ වෛද්‍ය සාෆි නමැති වෛද්‍යවරයා සිංහල ජාතික කාන්තාවන්ට වඳ සැත්කම් කළ බවට චෝදනා නැඟුණු බව එතුමා දන්නේද?

(ආ) (i) එම වෛද්‍යවරයාට එරෙහිව අධිකරණයේ පැවති නඩුවේදී ඔහු වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන්ගේ නම් හා ලිපින කවරේද;

(ii) එම වෛද්‍යවරයාට එරෙහිව මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම වෛද්‍යවරයාට එරෙහිව පවත්වන පරීක්ෂණ කඩිනම් කොට අගතියට පත් මව්වරුන්ට සාධාරණය ඉටු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) குருநாகல் போதனா வைத்தியசாலையில் பணியாற்றிய டாக்டர் சாபி எனும் மருத்துவர் சிங்களப் பெண்களுக்கு கருத்தடை சத்திர சிகிச்சைகளை மேற்கொண்டாரென குற்றச்சாட்டுகள் எழுந்ததென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி மருத்துவருக்கு எதிராக நீதிமன்றத்தில் தொடுக்கப்பட்டிருந்த வழக்கில் இவருக்காக ஆஜராகிய சட்டத்தரணிகளின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவையென்பதையும்;

(ii) மேற்படி மருத்துவருக்கு எதிராக இற்றைவரை மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்;

(iii) இந்த மருத்துவருக்கு எதிராக நடாத்தப்படும் விசாரணைகளை துரிதமாக மேற்கொண்டு பாதிப்புக்குள்ளாகிய தாய்மாருக்கு நீதியை நிலைநாட்டுவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු චමින්ද විජේසිරි මහතා]

asked the Minister of Justice:

(a) Is he aware that there were allegations against a doctor named Safi of the Kurunegala Teaching Hospital for performing sterilization surgeries on Sinhalese women?

(b) Will he inform this House of -

(i) the names and the addresses of the lawyers who appeared in court on behalf of him in the case filed against that doctor;

(ii) the courses of action taken against that doctor so far; and

(iii) the courses of action that will be taken to expedite the inquiries against that doctor and mete out justice to the aggrieved mothers;

(c) If not, why?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி - நீதி அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry - Minister of Justice)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) මෙවැන්නක් මාධ්‍ය මඟින් ප්‍රකාශ වූ බව දනිමි.

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) (i) අධිකරණය ඉදිරියේ විභාග වන නඩු සම්බන්ධයෙන් නීතිඥවරුන් සපයා ගැනීම හා වෙනස් කිරීම අදාළ පාර්ශ්ව සතු කර්තව්‍යයකි. අධිකරණ අමාත්‍යාංශයේ වගකීමක් නොමැත.

(ii) එය අධිකරණ අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ නොවේ. අධිකරණයේ පවත්නා නඩු සම්බන්ධයෙන් මැදිහත් වීමේ බලයක් අධිකරණ විෂය භාර අමාත්‍යවරයාට හෝ අධිකරණ අමාත්‍යාංශයට නොමැත.

(iii) අධිකරණය ඉදිරියේ පවතින නඩු කටයුත්තක් බැවින් එයට මැදිහත් වීමට අධිකරණ අමාත්‍යාංශයට නොහැක. එබැවින් එය අධිකරණ අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයේ (ආ) (ii) යටතේ මම ගරු ඇමතිතුමාගෙන් ඇහුවේ මේ නඩුවේ අභ්‍යන්තර කාරණා පිළිබඳව නොවෙයි. නඩු කටයුත්තක් පිළිබඳව අහන්න බැහැ කියලා මමත් දන්නවා. මේ නඩුවට ඉදිරිපත් වෙලා ඉන්න නීතිඥවරුන්ගේ නම් මොනවාද කියලායි මම අහන්නේ. නඩුව විභාග වන ක්‍රමවේදය පිළිබඳව ඇහුවොත් මම වැරදියි. එහෙම මට අහන්න බැහැ. මම මේ සුළු කාරණයක් අහන්නේ. මේ කටයුත්තට සම්බන්ධ වෙලා ඉන්න නීතිඥවරුන්ගේ නම් ටික විතරයි මම අහන්නේ. මේක වග කිව යුතු කාරණයක්.

ගරු කථානායකතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව ලබා ගැනීම වෙනුවෙන් සිංහල, බෞද්ධ ජනතාව තුළ තිබුණු මහා විරෝධයක් තමයි මේ සාෆි සිහාබ්ඩීන් කියන වෛද්‍යවරයා කරපු විනාශය. එම විනාශය පිළිබඳවයි මම මේ කාරණය අහන්නේ, ගරු ඇමතිතුමනි. මම දෙවැනි වතාවටයි මේ පාර්ලිමේන්තුවට නියෝජනය කරන්නේ. මම අහන්නේ එම නඩුවේ පෙනීසිටි නීතිඥවරුන්ගේ නම් පමණයි. නඩුවේ අභ්‍යන්තර කාරණා පිළිබඳව මම අහන්නේ නැහැ. ඒ නිසා, මට ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න කියායි මම ඉල්ලන්නේ. එහෙම නම්, අධිකරණ අමාත්‍යාංශයෙන් බැහැර වෙලා මේ ප්‍රශ්නය අහන්න තිබෙන, මේ තොරතුරු දැනගන්න තිබෙන අමාත්‍යාංශය මොකක්ද කියලා මට කියන්න. තමුන්නාන්සේලා එහෙම අමාත්‍යාංශයක් ගැසට් කරලා තිබෙනවාද?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

මේ වන විට ලංකාවේ නඩු 795,000ක් තිබෙනවා. ඒ නඩුවලට පෙනී සිටින නීතිඥවරුන්ගේ නම් ලබා දීමේ හැකියාවක් අධිකරණ අමාත්‍යාංශයට නැහැ. ඔබතුමාට ඒක අවශ්‍ය නම් මුදල් ගෙවලා, සහතික කළ පිටපතක් ලබාගන්න ඕනෑ. ඒක තව නඩුවක් විතරයි.

ගරු කථානායකතුමනි, එතුමා අහපු අනික් කාරණය තමයි, ඒ සම්බන්ධයෙන් එතුමා උපදෙස් ලබා ගන්න ඕනෑ කොහෙන්ද කියන එක. He must counsel himself. අධිකරණ අමාත්‍යවරයා හැටියට මට ඒ සම්බන්ධයෙන් වගකීමක් පැවරෙන්නේ නැහැ. එතුමා දැන ගන්නට ඕනෑ, අධිකරණ අමාත්‍යාංශය අධිකරණයේ තිබෙන නඩුවලට සම්බන්ධ වන්නේ නැති බව. ගිය ආණ්ඩුව වාගේ ඒ දේවල් සම්බන්ධයෙන් අපි කාටවත් කෝල් දෙන්නෙත් නැහැ. මිනිසුන් තෝරා ගෙන උසාවි හදන්නෙත් නැහැ. අධිකරණ අමාත්‍යාංශය හැටියට නියමිත විෂය පථයට සීමා වෙලා, අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම විතරයි අපි කරන්නේ. නඩු සම්බන්ධයෙන් මැදිහත් වීමේ කිසිම බලාපොරොත්තුවක් අපට නැහැ; ඒ සඳහා හැකියාවකුත් නැහැ. එය සිදු නොකළ යුතු දෙයක් කියලා මා තරයේ විශ්වාස කරනවා, ගරු කථානායකතුමනි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වුණාට පස්සේ ඔබතුමාත් කොතැන ඉඳීවිද කියලා තමයි අපි බලාගෙන ඉන්නේ.

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. ඔබතුමා ප්‍රශ්නයේ (අ) කොටසට උත්තරය දෙනවා නේ, "දන්නවා" කියලා. එහෙම නම්, මේ සිදු වීම පිළිබඳව ඔබතුමා දැනුවත් වුණු ප්‍රමාණය අනුව මට පිළිතුරු ලබාදෙන්න. මේ වඳ සැත්කම් ප්‍රමාණය කරගා තිබෙනවාද, නැද්ද කියන කාරණය පිළිබඳව ඔබතුමාගේ දැනුම මොකක්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණය මේ ප්‍රශ්නයට අදාළ නැහැ. [බාධා කිරීමක්] මම මේ මැදිහත් වන්නේ, අදාළ නැති ප්‍රශ්නයක් මතු කරලා මේ කාරණය වෙනත් පැත්තකට යොමු කරයි කියන හේතුව නිසායි. [බාධා කිරීම්]

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ඔබතුමා අහන්නේ අධිකරණයේ දැනට පවතින නඩුවක් ගැනයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මට ඒ චෝදනාව කරන්න එපා.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ඒ සම්බන්ධයෙන් ඔබතුමා මගෙන් තොරතුරු අහනවා. මම කොහොමද ඒකට පිළිතුරු ලබා දෙන්නේ? ඔබතුමාට මම මුලිනුත් ඒක කිව්වා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මම අහපු ප්‍රශ්නයේ (අ) කොටසට ඔබතුමා "දන්නවා" කියලා පිළිතුරු දුන්නා නේ.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
මොනවාද දන්නවා කිව්වේ?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒ දන්නවා කියන කාරණය තවත් තහවුරු කර ගන්න තමයි මම මේ කාරණය ඇහුවේ. අදාළ නොවෙනවා කියන කාරණය පිළිබඳව මාත් මවිත වෙනවා, ගරු කථානායකතුමනි. අලි සබ්රි ඇමතිතුමා මම අහපු ප්‍රශ්නයේ (අ) කොටසට උත්තර දුන්නා, "ඒ ගැන දැනුවත්" කියලා. ඒ දන්නා ප්‍රමාණය මේකද කියන කාරණය පිළිබඳවයි මම අහන්න හැදුවේ. මම දන්නේ නැහැ, එතුමා ඒ ගැන නොදැනුවත් කියන කාරණය.

ගරු ඇමතිතුමනි, ඔබතුමා පසුගිය ආණ්ඩුව කාලයේ සිද්ධ වුණු දේවල් ගැන කථා කළා, ඒක ඒ මන්ත්‍රීවරයාට අදාළ ප්‍රශ්නයක්. අපි එහෙම කථා කරලා නැහැ නේ. ඒ සම්බන්ධයෙන් තවම විමර්ශනය කරනවා. අපි බලාපොරොත්තු වෙනවා හොඳ, බුද්ධිමත් ජනාධිපති නීතිඥයකු හැටියට ඔබතුමා ඔවුන්ට දඬුවම් දේවි කියලා. ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, පැවතුණු ආණ්ඩුව තුළදීත්, ඒ ආණ්ඩුවේ තිබුණු වැරදිවලට දඬුවම් දෙන්න කියලා අපි කෑ ගැසූ බව. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවාට පසුව මේ ටයිකෝට් ඇඳගෙන ඉන්න අපේ ගරු ඇමතිතුමා ඒ ආණ්ඩුවටත්, මේ ආණ්ඩුවටත් සලකන හැටි අපි බලමු, ගරු කථානායකතුමනි.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

මට මේ විධියට අඳින්න බැරිද, ගරු මන්ත්‍රීතුමනි? මම ඔබතුමා වාගේ අඳින්න ඕනෑද? ඔබතුමාගේ අවසරය අරගෙන, ඔය විධියට මම අඳින්න ඕනෑද? මට අවශ්‍ය ඇඳුම මම අඳිනවා. මම අඳින්න ඕනෑ ඇඳුම ගැන ඔබතුමා කියන්න ඕනෑ නැහැ. මම අඳින්නේ අධිකරණයට අවශ්‍ය විධියට. ඔබතුමාට අවශ්‍ය විධියට මම අඳින්න ඕනෑද? ඔබතුමා කවුද? ඔබතුමා නිකම් බොරුවට මෙතැන ජාතිවාදය අවුස්සන්න එපා. ඔය ප්‍රශ්නයේ තේරුම මොකක්ද? අධිකරණයේ පවතින නඩු පිළිබඳව අපෙන් අහන්නේ ඇයි? ඔබතුමාට ජාතිවාදය අවුස්සන්නද අවශ්‍ය වෙලා තිබෙන්නේ? [බාධා කිරීම්]ඔබතුමන්ලා සහජීවනය පිළිබඳව කථා කරන්නකෝ. [බාධා කිරීම්] ඔය කථා කරන්නේ මොනවාද? තනිකරම ජාතිවාදය අවුස්සන්න තමයි ඔය දේවල් කථා කරන්නේ. ඔය කථාව වැරදියි. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔන්න, වියත් මගේ හැටි! ලජ්ජයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14 - 99/2020 - (1), ගරු බුද්ධික පතිරණ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 15 -123/2020 - (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ප්‍රශ්න අහන එක පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරයකුට තිබෙන අයිතියක්. ගරු ඇමතිවරයකුට තිබෙන වගකීම තමයි, බොහොම බුද්ධිමත්ව, පරිණත ආකාරයට ඒවාට උත්තර දෙන එක. මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ හා හා පුරා කියලා මුලින්ම ආපු ඇමතිවරයකු අද මේ කෝප වෙලා, බොහොම ආවේගශීලිව,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

චණ්ඩියෙක් වාගේ මේ විධියට හැසිරෙන්නේ මොකද? කෝප වෙලා, ගණන්කාරයකු, චණ්ඩියකු වාගේ හැසිරෙනවා. වියත් මගද මේ? මේ ගොල්ලන්ට කරුණාකරලා අර මූලික පුහුණුව දෙන්න, මොන්ටිසෝරියට යවන්න. [බාධා කිරීමක්] එතුමන්ලාට පාර්ලිමේන්තුව ගැන මූලික පුහුණුව දෙන්න.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඇති. ගරු මොහමඩ් මුසම්මිල් මන්ත්‍රීතුමනි, ඔබතුමා මොකක්ද කියන්නේ?

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු කථානායකතුමනි, ඔබතුමා වමේ කෙනෙක්. ඒ වුණාට පොඩ්ඩක් දකුණු පැත්තත් බලන්න.

ගරු කථානායකතුමනි, මගේ point of Order එක මේකයි. ස්ථාවර නියෝග 36(ඊ) අනුව, අධිකරණ විනිශ්චයට භාජන

[ගරු මොහමඩ් මුසම්මිල් මහතා]

වෙමින් පවතින යම් කාරණයක් හෝ අධිකරණ තීරණයක් ලබාදීමට නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අහන්න බැහැ. මම ඉදිරිපත් කරන පළමුවැනි කාරණය ඒකයි. ඒ ප්‍රශ්නය අහන්න බැහැ.

දෙවැනි කාරණය, එහෙම නම් ඒ ප්‍රශ්නය න්‍යාය පත්‍රයට ඇතුළු කරන්නත් බැහැ. ඉතා පැහැදිලිව, "අධිකරණයක විනිශ්චය වෙන කාරණයක්" කියන එක සාමාන්‍ය දැනුම තිබෙන ඕනෑම කෙනෙකු දන්නවා. එතකොට මේ ප්‍රශ්නය න්‍යාය පත්‍රයට ඇතුළු වුණේ කොහොමද? ඒක කරන්නත් බැහැ නේ, ගරු කථානායකතුමනි. ඒ නිසා ඉතා පැහැදිලිව මෙය රීති කඩවීමක් විධියට මම දකිනවා.

සාෆි සහබ්දීන්ගේ සිද්ධිය ගැන පසුගිය කාලයේ මේ අය මුනිවත රැකලා, දැන් ඇවිල්ලා නීතිඥයන් කවුද කියලා අහනවා. පසුගිය කාලයේ කුරුණෑගල ඉන්නකොට අඩු ගණනේ එක ලැයිස්තුවේ හිටපු කට්ටියවත් ඒ ගැන කථා කළේ නැහැ. ඒ වෙලාවේ සාෆි සහබ්දීන්ලා ගැන කථා කළේ නැහැ. දැන් මේ ගරු සභාවේදී ඒ ගැන ප්‍රශ්න අහන්නේ මොකද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, මටත් කාරණයක් කියන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු ඇමතිතුමනි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ අපේ තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමා කිව්වා, "වියත් මගෙන් ඇවිල්ලා හැසිරෙන්න දන්නේ නැහැ, කථා කරන්න දන්නේ නැහැ, ආවේගශීලීයි" කියලා. මම හිතන විධියට එයට ප්‍රධාන හේතුව තමයි, ප්‍රශ්නය අහපු ගරු මන්ත්‍රීතුමා අපේ ගරු ඇමතිතුමාගේ ටයි කෝට් ගැන කථා කරලා අනවශ්‍ය ප්‍රශ්නයක් ඇදගත්ත එක. එතුමාට පහර දෙන්න හදන්නේ නැතිව, ඉස්සර වෙලා තමුන්නාන්සේලා වැදගත් වෙන්න. එතුමා පාර්ලිමේන්තුවට සුදුසු විධියට තමයි ඇඳගෙන ඇවිල්ලා තිබෙන්නේ. එහෙම කියන එක වැරදියි. ඔබතුමා ඒක ඉල්ලා අස්කරගන්න. ඒක සම්පූර්ණයෙන් වැරදියි. [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
( மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 31 යටතේ අපට ඒ අදාළ අමාත්‍යවරයාගෙන් ප්‍රශ්න අහන්න පුළුවන්. අපේ ගරු මන්ත්‍රීතුමා, ගරු ඇමතිතුමාට එහෙම වැරදි අදහසකින් කිව්වා නොවෙයි. අනෙක් එක ගරු ඇමතිතුමනි, අපේ සම්ප්‍රදායක් තිබෙනවා, නේ. මේ පාර්ලිමේන්තුවේදී යම්කිසි ප්‍රශ්නයක් ඇහුවාම ඒකට කෑ කෝ ගහලා, සැර කරලා කථා කරන්නේ නැහැ. මොකද අපි ප්‍රශ්නයක්,- [බාධා කිරීම්]

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඔබතුමන්ලා තමයි පටන් ගත්තේ. ඔබතුමාත් ටයි, කෝට් ඇඳලා නේ ඉන්නේ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම පිළිගන්නවා. නමුත් ඒක වැරැද්දකට කියපු දෙයක් නොවෙයි. පොඩ්ඩක් ඉන්නකෝ. [බාධා කිරීම්] ඒක තමයි මම කියන්නේ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් සාධාරණ ඉල්ලීමක් කරන්නේ. සාමාන්‍යයෙන් එහෙම ඇඟිල්ල දිගු කරලා කෑගහන්න එපා. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මේක උසාවිය නොවෙයි.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
Sir, I rise to a point of Order.

මම එහෙම අදහසකින් කිව්වේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මගේ ඇඳුම පිළිබඳව කථා කළ නිසා තමයි මම පිළිතුරක් ලබාදුන්නේ. ඒ ගැන එතුමා යම්කිසි අපහසුතාවකට පත්වුණා නම් මම සමාව අයැදිනවා. මට ඒක ලොකු ප්‍රශ්නයක් නොවෙයි. ඒ මගේ හැටි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
හොඳයි, ගරු ඇමතිතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඔක්කොම හරි නේ.

ප්‍රශ්න අංක 15 - 123/2020 - (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. [බාධා කිරීමක්]

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මාත් කොහොමත් ටයි කෝට් තමයි ඇන්දේ. ඔබතුමාට ටයි කෝට් ගැන ප්‍රශ්නයක් තිබෙනවාද, ගරු මන්ත්‍රීතුමනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු අමාත්‍යතුමනි, ඔබතුමා නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර දෙන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි වටය

## නාවික හමුදාවේ තාවකාලික සේවකයන්: සේවය ස්ථිර කිරීම

## இலங்கை கடற்படையின் தற்காலிக ஊழியர்கள்: நிரந்தர நியமனம்

CASUAL WORKERS OF SRI LANKA NAVY : MAKING PERMANANT

95/2020

**3. ගරු චමින්ද විජේසිරි මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)**
(மாண்புமிகு சமிந்த விஜேசிறி - மாண்புமிகு புத்திக பத்திரண சார்பாக)
(The Hon. Chaminda Wijesiri on behalf of the Hon. Buddhika Pathirana)

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා නාවික හමුදාවේ සිවිල් පාලන නිලධාරි කාර්යාලයට අනුයුක්තව කොන්ත්‍රාත්/ ආදේශක/ අනියම් පදනම යටතේ විශාල පිරිසක් සේවය කරන බවත්;

(ii) ඔවුන් දිවයින පුරා පිහිටි නාවික හමුදා උප කාර්යාලවල හා නාවික හමුදා රෝහල් ආදියෙහි සේවය කරන බවත්;

(iii) දෛනික පදනම මත ඔවුන්ට වැටුප් ගෙවන බවත්;

එතුමා දන්වන්නේද?

(ආ) (i) ඔවුන්ගේ සේවය ස්ථිර කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ගේ සේවය ස්ථිර කිරීමට කටයුතු කරන්නේ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் நிதி அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை கடற்படையின் சிவில் நிருவாக உத்தியோகத்தர் அலுவலகத்திற்கு இணைந்ததாக ஒப்பந்த/ பதில்/ அமைய அடிப்படையில் பாரிய எண்ணிக்கையிலானோர் சேவையாற்றுகின்றனர் என்பதையும்;

(ii) அவர்கள் நாடளாவிய ரீதியில் அமைந்துள்ள கடற்படை பிரிவுகளில் உப அலுவலகங்கள் மற்றும் கடற்படை வைத்தியசாலைகளில் பணியாற்றுகின்றார்கள் என்பதையும்;

(iii) நாளாந்த அடிப்படையில் அவர்களுக்கு சம்பளம் செலுத்தப்படுகின்றதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) அவர்களை சேவையில் நிரந்தரமாக்குவதற்குரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அந்நடவடிக்கைகள் யாவையென்பதையும்;

(iii) அவர்களை சேவையில் நிரந்தரமாக்குவதற்குரிய நடவடிக்கைகள் எத்திகதியிலிருந்து மேற்கொள்ளப்படும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Finance, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing:

(a) Is he aware that-

(i) a large number of persons serve on contract/ substitute/ casual basis attached to the Civil Administration Office of the Sri Lanka Navy;

(ii) these employees serve in detachments and hospitals of the Navy located throughout the island; and

(iii) salaries are paid to them on a daily basis?

(b) Will he inform this House-

(i) whether measures have been taken to give them permanent appointments;

(ii) if so, what those measures are; and

(iii) the date they would be given permanent appointments?

(c) If not, why?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) 2020.09.17 දිනට කොන්ත්‍රාත් හෝ ආදේශක පදනම මත කිසිදු සේවකයෙකු නොමැත. මුදල් රෙගුලාසි 95 (මු.රෙ. 95) මත තාවකාලික කම්කරු සේවක මහත්ම මහත්මීන් 47 දෙනෙකු සේවය කරනු ලබයි.

(ii) මු.රෙ. 95 තාවකාලික කම්කරු සේවක මහත්ම මහත්මීන් දිවයින පුරා පවතින නාවික හමුදා කඳවුරු තුළ සේවය කරනු ලබයි.

[ගරු චමල් රාජපක්ෂ මහතා]

| කඳවුර | සේවක සංඛ්‍යාව |
|---|---|
| නාවික හමුදා මූලස්ථානය | 17 |
| ශ්‍රීලංනානෞ ත්‍රිකුණාමලය | 10 |
| ශ්‍රීලංනානෞ පණ්ඩුකාභය | 07 |
| ශ්‍රීලංනානෞ ගැමුණු | 06 |
| ආ.සේ.වි. බටලන්ද | 02 |
| ශ්‍රීලංනානෞ රංගල | 02 |
| ශ්‍රීලංනානෞ නිපුණ | 01 |
| ශ්‍රීලංනානෞ රුහුණ | 01 |
| ශ්‍රීලංනානෞ ෆේරපුත්ත | 01 |

(iii) සේවයට පැමිණීම මත දිනකට රු. 1068.00ක් ගෙවනු ලබයි.

(ආ) (i) ඔව්.

(ii) මු.රෙ. 95 මත සේවක මහත්ම මහත්මීන් බඳවා ගෙන ඇති ක්‍රියා පටිපාටිය අනුව ඔවුන්ගේ සේවා කාලය මාසිකව බණ්ධනය වන හෙයින් අඛණ්ඩ සේවය පිළිබඳ ගැටලුසහගත තත්ත්වයක් පවතින අතර ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු අමාත්‍යාංශ මට්ටමින් සිදු කරමින් පවතී.

(iii) අදාළ ගැටලු නිරාකරණය කර ගැනීමෙන් පසු ස්ථිර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

## මීතොටමුල්ල කසළ කන්ද නාය යෑමෙන් හානි වූ රථ වාහන: වන්දි

## மீதொட்டமுல்லை குப்பை மேடு சரிந்ததால் சேதத்துக்குள்ளான வாகனங்கள்: நட்டஈடு

## VEHICLES DAMAGED DUE TO MEETHOTAMULLA GARBAGE DUMP COLLAPSE: COMPENSATION

159/2020

**7. ගරු චමින්ද විජේසිරි මහතා (ගරු එස්.එම්. මරික්කාර් මහතා වෙනුවට)**

(மாண்புமிகு சமிந்த விஜேசிறி - மாண்புமிகு எஸ்.எம். மரிக்கார் சார்பாக)

(The Hon. Chaminda Wijesiri on behalf of the Hon. S.M. Marikkar)

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2017 වර්ෂයේදී මීතොටමුල්ල කසළ කන්ද නාය යෑම හේතුවෙන් ජීවිත, නිවාස මෙන්ම රථවාහන ද හානියට පත් වූ බවත්;

(ii) එහිදී අහිමි වූ ජීවිත සහ නිවාස සඳහා වන්දි මුදල් ලබා දීමට හැකි වූ බවත්;

එතුමා දන්නේද?

(ආ) මීතොටමුල්ල කසළ කන්ද නාය යෑම හේතුවෙන් හානි වූ රථවාහන සඳහා -

(i) වන්දි ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) වන්දි ලබා දීමේ ක්‍රමවේදය කවරේද;

(iii) වන්දි ඉල්ලා ලැබී ඇති අයදුම්පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iv) වන්දි ලබා දීමට රජයේ තක්සේරුවක් සිදු කරනු ලැබුවේද;

(v) එසේ නම්, එකී තක්සේරුවට අනුව වන්දි ලබා දුන් රථවාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) වන්දි ලබා නොදුන් රථවාහන සඳහා වන්දි ලබා දෙන දිනය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சர் மற்றும் நிதி அமைச்சர், புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர் மற்றும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2017 ஆம் ஆண்டில் மீதொட்டமுல்லை குப்பை மேடு சரிந்ததால் உயிர்ச் சேதங்கள், வீடுகள் மற்றும் வாகனங்கள் பாதிப்புக்குள்ளாகியது என்பதையும்;

(ii) அதன்போது ஏற்பட்ட உயிரிழப்புக்கள் மற்றும் வீடுகளுக்கான நட்ட ஈட்டுத்தொகை வழங்க முடிந்ததென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) மீதொட்டமுல்லை குப்பை மேடு சரிந்ததால் சேதத்துக்குள்ளான வாகனங்களுக்காக -

(i) நட்டஈடு வழங்குவதற்கு நடவடிக்கை மேற் கொள்ளப்படுமா என்பதையும்;

(ii) நட்டஈடு வழங்கப்படும் முறைமை யாதென் பதையும்;

(iii) நட்டஈட்டைக் கோரி கிடைக்கப்பெற்றுள்ள விண்ணப்பங்களின் எண்ணிக்கை யாதென் பதையும்;

(iv) நட்டஈடு வழங்குவதற்காக அரசாங்கத்தால் மதிப்பீடொன்று மேற்கொள்ளப் பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அம்மதிப்பீட்டுக்கு அமைவாக நட்டஈடு வழங்கப்பட்ட வாகனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) நட்டஈடு வழங்கப்படாத வாகனங்களுக்காக நட்டஈடு வழங்கப்படும் திகதி யாதென்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Finance, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing:

(a) Is he aware that-

(i) death and destruction have been caused to lives, houses and vehicles due to the Meethotamulla garbage dump collapse in 2017; and

(ii) compensation payments were awarded in connection with losses of lives and damages caused to houses in that case?

(b) Will he inform this House-

(i) whether compensation will be granted for the vehicles affected by Meethotamulla garbage dump collapse;

(ii) the methodology of granting compensation;

(iii) the number of applications received for compensation;

(iv) whether a government valuation was conducted to grant compensation; and

(v) if so, the number of vehicles for which compensation was granted as per aforesaid valuations?

(c) Will he also inform this House of the date on which compensation will be granted for the vehicles for which the compensation was not granted?

(d) If not, why?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) ඔව්.

(ii) භෞතිකව හානි පෙනෙන වාහන සම්බන්ධයෙන් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් සහ භෞතිකව හානි නොපෙනෙන වාහන හානි පිළිබඳ රජයේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් වාහන තක්සේරු කර වන්දි ගෙවීමට අදාළව 2020.03.02 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද අමප 20/0658/203/058 හා 2020.06.10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පහත තීරණ සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

- පූර්ණ රක්ෂණාවරණය හිමි වාහන සඳහා වාහන තක්සේරු කමිටුව හෝ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කළ වටිනාකමට වඩා රක්ෂණ ආයතනය මඟින් ලබාදී ඇති රක්ෂණ වන්දි මුදල අඩුවන්නේ නම් එම හිඟ මුදල ප්‍රතිලාභීන්ට ගෙවීමට

- තෙවන පාර්ශවයේ රක්ෂණාවරණය හිමි වාහන සඳහා වාහන තක්සේරු කමිටුව හෝ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කළ වටිනාකම ප්‍රතිලාභීන් වෙත ගෙවීමට

- හානි වූ වාහන සඳහා වන්දි ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදන ඉදිරි අය වැය තුළින් සලසා ගැනීමට

(iii) අයදුම්පත්‍ර සංඛ්‍යාව 36කි.

(iv) ඔව්.

(v) මෙතෙක් ලබා දී නොමැත.

(ඇ) 2021 අය වැය මඟින් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය ඇතුළත් කර ඇති අතර, ඒ සඳහා ඉදිරි වර්ෂයේදී ප්‍රතිපාදන ලද පසු උක්ත අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත වන්දි ලබා දීමට කටයුතු කරනු ලබයි.

(ඈ) අදාළ නොවේ.

## වෛතලාව වත්තේ "උදාගම්මාන නිවාස වැඩසටහන": විස්තර
## வைத்தலாவ தோட்ட 'உதா கம்மான வீட்டு திட்டம்': விபரம்
## "VILLAGE REAWAKENING HOUSING PROGRAMME" IN WAITHALAWA ESTATE: DETAILS

250/2020

**9. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු වේලු කුමාර් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு வேலு குமார் சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Velu Kumar)

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ, තෙල්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වෛතලාව වත්තේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් "උදා ගම්මාන නිවාස වැඩසටහන" ආරම්භ කර ඇති බව එතුමා දන්නේද?

(ආ) එකී වැඩසටහන යටතේ ඉහත වත්තේ ආරම්භ කර ඇති -

(i) උදා ගම්මාන නිවාස වැඩසටහන් සංඛ්‍යාව;

(ii) එක් එක් වැඩසටහනට ඇතුළත් නිවාස සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) එක් නිවසක් ඉදිකිරීම සඳහා එක් එක් නිවාසලාභියාට -

(i) ලබාදෙන බවට එකඟවූ මුළු මුදල;

(ii) ලබා දෙන මුළු මුදලින් ණය මුදල;

(iii) ලබා දෙන මුළු මුදලින් ආධාර මුදල;

(iv) මෙතෙක් ලබාදී ඇති මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) එක් එක් නිවාසලාභියාට අදාළ ඉතිරි මුදල ලබාදී මෙම ව්‍යාපෘතිය නිම කිරීමට පියවර ගන්නේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் நிதி அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) கண்டி மாவட்டத்தின் தெல்தெனிய பிரதேச செயலக பிரிவில் அமைந்துள்ள, அரச பெருந்தோட்ட கூட்டுத் தாபனத்திற்குச் சொந்தமான வைத்தலாவ தோட்டத்தில், தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகார சபையினால் "உதா கம்மான வீட்டு திட்டம்" ஆரம்பிக்கப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) இந்நிகழ்ச்சித்திட்டத்தின் கீழ் மேற்குறிப்பிட்ட தோட்டத்தில் ஆரம்பிக்கப்பட்டுள்ள -

(i ) ஒவ்வொரு உதா கம்மான வீடமைப்புத் திட்டங் களின் எண்ணிக்கை;

(ii ) திட்டத்தில் உள்ளடக்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை;

தனித்தனியே யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(இ) வீடொன்றை நிர்மாணிப்பதற்கு ஒவ்வொரு பயனாளிக்கும் -

(i) பெற்றுத்தருவதாக இணங்கிய தொகை;

(ii) பெற்றுக்கொடுக்கப்படும் மொத்தத் தொகையில் கடன் தொகை;

(iii) பெற்றுக்கொடுக்கப்படும் மொத்தத் தொகையில் உதவித் தொகை;

(iv) இற்றைவரையில் பெற்றுக்கொடுக்கப்பட்டுள்ள தொகை;

தனித்தனியே எவ்வளவென்பதையும் அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஈ) ஒவ்வொரு பயனாளிக்கும் எஞ்சிய பணத்தை பெற்றுக் கொடுத்து இக்கருத்திட்டத்தை பூர்த்திச் செய்வதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும் மேலும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Finance, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing:

(a) Is he aware that the National Housing Development Authority has commenced the "Reawakening Village Programme" in the Waithalawa Estate owned by the State Plantations Corporation situated in Theldeniya Divisional Secretary's Division of Kandy District?

(b) Will he inform this House, separately-

(i) the number of each Village Reawakening Housing Programmes commenced in the above Estate under the said programme; and

(ii) the number of houses each Village Reawakening Housing Programme consist of?

(c) Will he also inform this House, separately-

(i) the amount of money agreed to each recipient of houses for constructing a house;

(ii) the loan portion out of the total amount of money that has been made available;

(iii) the donation portion out of the total amount of money that has been made available; and

(iv) the amount of money that has been made available up to now?

(d) Will he also inform this House whether steps will be taken to complete this project by making the balance amount of money available to each recipient of houses?

(e) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඔව්.

(ආ) (i) නිවාස ව්‍යාපෘති 2ක් ආරම්භ කර ඇත.

(ii)

| <u>ව්‍යාපෘතියේ නම</u> | <u>නිවාස සංඛ්‍යාව</u> |
|---|---|
| වෛතලාවත්ත | 28 |
| ආදීලෙව්වම්වත්ත | 20 |
| එකතුව | 48 |

(ඇ) (i) රුපියල් මිලියන 0.5යි. (ලක්ෂ 5යි)

(ii) නැත. (ආධාර පමණි)

(iii) රුපියල් මිලියන 0.5යි. (ලක්ෂ 5යි)

` (iv) ඉහත (ආ) (ii) හි සඳහන් ව්‍යාපෘති 2 සඳහා මෙතෙක් ලබා දී ඇති මුළු මුදල රුපියල් මිලියන 5.28යි.

(ඈ) ඔව්.

භාණ්ඩාගාරය වෙත අදාළ අවිච්ඡේද වැඩසටහන්වල මුදල් අවශ්‍යතාව ලබා දී ඇත. අය වැය මඟින් අවිච්ඡේද වැඩසටහන් සඳහා මුදල් වෙන් කිරීමෙන් අනතුරුව ඉදිකිරීම් ප්‍රමුඛතාව අනුව මුදල් ලබා දීම සිදු කරනු ඇත.

(ඉ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 14 -99/'2020- (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

ගරු කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ශෝක ප්‍රකාශ යෝජනා. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අසනු ලබන ප්‍රශ්න සම්බන්ධයෙන් ඊයේ මේ ගරු සභාවේදී ගැටලුවක් මතු වුණා. එතැනදී ස්ථාවර නියෝග 27(2) යටතේ පොන්නම්බලම් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය, -විශේෂයෙන්ම අධිකරණයක පවතින නඩුවකට සම්බන්ධ කාරණයක් නිසා- ස්ථාවර නියෝග 36(ඊ) යටතේ ඔබතුමා ඉවත් කළාය කියන කාරණය එක පැත්තකින් ඉස්මතු වුණා. අනෙක් පැත්තෙන්, පොන්නම්බලම් මන්ත්‍රීතුමා පක්ෂ නායකයකු විධියට සලකන්න විපක්ෂය කටයුතු නොකළාය කියන කාරණයත් ඉස්මතු වුණා. හැබැයි, පොන්නම්බලම් මන්ත්‍රීතුමා පක්ෂ නායකයකු විධියට සලකලා තමයි එතුමාට ඒ ස්ථානය දීලා තිබෙන්නේ. අධිකරණයේ විමර්ශනයට භාජන වන කටයුත්තක් ලෙස සලකා, ස්ථාවර නියෝග 36(ඊ) යටතේ එම ප්‍රශ්නය ඉවත් කළා නම්, ඒක ස්ථාවර නියෝග 27(2) යටතේ අහන ප්‍රශ්නයකට බලපාන්නේ නැහැ නේ, ගරු කථානායකතුමනි. අපට තිබෙන ප්‍රශ්නය මේකයි. ඔබතුමා ඊයේ ඒ ප්‍රශ්නය ඉවත් කළේ, ස්ථාවර නියෝග 36(ඊ) යටතේද, එහෙම නැත්නම් ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න අහන්න පුළුවන් පක්ෂ නායකයෙකුට පමණක් නිසා, එතුමා පක්ෂ නායකයකු විධියට නොසැලකීම නිසාද? ඔබතුමා ඒක අපට පැහැදිලි කර දෙන්න. ඒක ඊයේ හරියට පැහැදිලි වුණේ නැහැ. මේ ගරු සභාව තුළ ඊයේ ඒ කරුණු දෙක ගැන කථා කළා. ඊයේ එතුමාගේ ප්‍රශ්නය ඉවත් කළේ ස්ථාවර නියෝග 36(ඊ) යටතේද, එහෙම නැත්නම් ස්ථාවර නියෝග 27(2) යටතේ එතුමාට ප්‍රශ්නයක් ඇසීමට අවස්ථාව ලබාදිය නොහැකි නිසාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පක්ෂ නායකයකු හැටියට පිළිගෙන නේ එතුමාට ඊයේ ඒ අවස්ථාව ලබා දුන්නේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
එහෙම නම්, ඔබතුමා එතුමාට ඒ ප්‍රශ්නය අහන්න අවස්ථාව නොදුන්නේ ඇයි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එම ප්‍රශ්නයට අදාළ කාරණය අධිකරණය ඉදිරියේ විභාග වෙමින් තිබෙන නඩුවක් හා සම්බන්ධයි. එතුමා ඉදිරිපත් කළ කාරණය නිවැරදි නැහැ කියන එකයි අපේ හැඟීම. මොකද, ඊයේ උදේත් උසාවියෙන් නඩු තීන්දුවක් දුන්නා. අද එතුමා මේ සභාවේ නැත්තේ, ඒ සම්බන්ධ නඩුවකට උසාවියේ පෙනී සිටීමට ගිහින් තිබෙන නිසායි. ඒ නිසා තමයි මම කිව්වේ, අධිකරණයේ විනිශ්චයට භාජන වෙමින් තිබෙන කරුණක් නිසා අපි ඒ ප්‍රශ්නය ඉවත් කළා කියලා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, ඔබතුමා කිව්වා, ස්ථාවර නියෝග 27 (2) යටතේ දවසකට එක ප්‍රශ්නයයි අහන්න පුළුවන් කියලා. නමුත්, ස්ථාවර නියෝගවල එහෙම දෙයක් සඳහන් වෙලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පක්ෂ නායක රැස්වීමේදී සාකච්ඡා කරලා අපි ඒක නිරාකරණය කර ගන්නම්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මා මේ මතු කරන්නේ වැදගත් කාරණයක්. ස්ථාවර නියෝග 121 යටතේයි මම මේ ප්‍රශ්නය අහන්නේ. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු විය යුත්තේය යන්නට යටත්ව තේරීම් කාරක සභාව විසින් සභාපතිවරයකු හා සාමාජික මන්ත්‍රීවරුන් එකොළොස් දෙනෙකු පත් කළ යුතු යැයි කියලා තිබෙනවා. සමහර කාරක සභා පත් කරලා තිබෙනවා. නමුත් මේ කාරක සභාව තවම පත් කරලා නැහැ. අපි ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, මේ කාරක සභාව කවදා වෙන කොට පත් කරන්න ඔබතුමා බලාපොරොත්තු වෙනවාද කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තවම නාම යෝජනා එවලා නැහැ. තවම නම් ටික එවලා නැහැ. නම් එව්වාම පත් කරන්නම්. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි විපක්ෂයෙන් යෝජනා කරන්නේ හර්ෂ ද සිල්වා මැතිතුමාගේ නම.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක ලිපියකින් එවන්න එපා යැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා, හර්ෂ ද සිල්වා කියන මා සභාපති හැටියට නම් කරලා ඔබතුමා දැනුවත් කරලා තිබෙනවා. ඒ පත්වීම තවම වෙලා නැහැ. ඒකයි, ඒ ඇයි කියලා අහන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Our nominee is the Hon. (Dr.) Harsha de Silva.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay, thank you. මීළඟට, ශෝක ප්‍රකාශ යෝජනාව.

## ශෝක ප්‍රකාශය: ගරු ආර්.එම්.කේ.බී. රත්නායක මහතා
## அனுதாபத் தீர்மானம்: மாண்புமிகு ஆர்.எம்.கே.பீ. ரத்நாயக்க
## VOTE OF CONDOLENCE: HON. R.M.K.B. RATNAYAKE

[පූ.භා.10.58]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (විදේශ අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - வெளிநாட்டு அலுவல்கள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Foreign and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, පඩුවස්නුවර ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව නියෝජනය කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්.එම්. කළුබණ්ඩා රත්නායක මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාව මා මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරමි.

මාකෙළියාව, කොබෙයිගනේදී 1926 අප්‍රේල් මස 1වැනි දින ජන්ම ලාභය ලැබූ ආර්.එම්. කළුබණ්ඩා රත්නායක මැතිතුමා, මැට්‍රිකියුලේෂන් විභාගය දක්වා කොබෙයිගනේ මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඇත. එතුමන් සී.එම්. චන්ද්‍රසේකර රත්නායක මැතිනිය සමඟ විවාහ පත් වී රටට, ප්‍රදේශයට, සමාජයට වැඩ ඇති දූ දරුවන් එකොළොස් දෙනෙකු ලක් මවට දායාද කළේය. ඒ අතර හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ ආර්.එම්. චූල බණ්ඩාර මැතිතුමා, වයඹ පළාත් සභාවේ හිටපු මහ ඇමති ආර්.එම්. නිමල් බණ්ඩාර මැතිතුමා, වෛද්‍ය ආර්.එම්. ධම්මික රත්නායක මැතිතුමා, මේජර් ජනරාල් ආර්.එම්. ජනක රත්නායක මැතිතුමා, විශ්‍රාමික විදුහල්පතිනියක් වූ ආර්.එම්. සීතා තෙන්නකෝන් මැතිනිය ද වේ.

වයස අවුරුදු 23දී දේශපාලනයට පිවිසි එතුමන් හෙට්ටිපොළ ගම්සභාවේ දිග්ගල ගෙදර කොට්ඨාසයේ මන්ත්‍රීවරයකු වශයෙන් පත්ව, පසුව 1958 දී හෙට්ටිපොළ ගම්සභාපති ලෙසද, නැවත පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙසද, කටයුතු කළ එතුමා 1977 වර්ෂයේදී පඩුවස්නුවර නව මැතිවරණ කොට්ඨාසයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් පඩුවස්නුවර ජනතාව වෙනුවෙන් මහත් මෙහෙවරක් ඉටු කළ දේශපාලනඥයෙකි; පොදුජන යහපත වෙනුවෙන් කැප වූ නායකයෙකි.

එතුමා වාරි මාර්ග හා කෘෂි කර්මාන්තයට දැක් වූ උනන්දුව අති මහත්ය. කෘෂි කර්මාන්තයට දැක්වූ උනන්දුව මත 1968 වර්ෂයේ දී කුරුණෑගල දිස්ත්‍රික්කයේ "ගොවි රජා" බවට ද තේරී පත් විය. තවද 1977 වර්ෂයේ දී දිවුල්වැව වෙල්යායේදී පළමුවැනි වප්මඟුල් උත්සවය පැවැත්වීම එතුමන්ගේ මූලිකත්වයෙන් සිදු විය. එමෙන්ම 1978 වර්ෂයේ මාර්තු මස පැවැති "රන්කරල්" උත්සවය ද එතුමන් සංවිධානය කරන ලද්දකි.

පඩුවස්නුවර ආසනයේ පිහිටි වැව් හා අමුණු විශාල සංඛ්‍යාවක් එතුමා විසින් පිළිසකර කර දී ඇත. වයඹ පළාතේ වැව්වල යන්ත්‍රානුසාරයෙන් රොන්මඩ ඉවත් කිරීම ආරම්භ කරන ලද්දේ ද මෙතුමා විසිනි. ප්‍රදේශයේ ගොවි ජනතාවගේ යහපත පිණිස පඩුවස්නුවර ගොවිජන සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම එතුමාගේ මූලිකත්වයෙන් සිදු විය.

යහපත් පුරවැසියන් බිහිකිරීමේ අභිලාෂයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය නඟා සිටුවීමට එතුමා නොමැකෙන සේවයක් සිදු කර ඇත. බණ්ඩාරකොස්වත්ත, කොළඹගම, කිරිමැටියාව, මදුල්ල, මඩිගෙ, මිදියාල, ඇපලදෙණිය, කොස්දෙණිය ආදී විදුහල් මහා විද්‍යාල බවට පත් කිරීමත්, රත්මුලුකන්ද සහ කනතලව විදුහල් ආරම්භ කිරීමත් එතුමා දරුවන්ගේ අධ්‍යාපනය නඟා සිටුවීමට සිදු කළ මහඟු සේවා අතරින් කිහිපයකි.

පෙර රජ දවස පඩුවස්නුවර දළදා වහන්සේ වැඩ සිටි බවට ජනප්‍රවාදයේ සඳහන් වන බැවින්, අතීතයේ දළදා උපහාර පෙරහැර පැවැත්වූ අයුරින් දළදා පෙරහැරක් පැවැත්වීමට එතුමාටද අවශ්‍ය විය. මෙම අදහසට නාහිමිපාණන් වහන්සේලාගේද උපදෙස් ලබා ගත් එතුමා එහි ප්‍රතිඵලයක් ලෙස 1979 සැප්තැම්බර් මස පඩුවස්නුවර රජමහා විහාරයේ දළදා උපහාර පෙරහැර පැවැත්විය. එම පෙරහැර එතැන් සිට අවුරුදු දහතුනක් වාර්ෂිකව නොකඩවා පැවැත්වීමට ද එතුමා කටයුතු කළේය.

පෞරාණික පඩුවස්නුවර රාජධානියේ පැරණි නටබුන් සුරක්ෂිත කිරීමටත්, අනාගත පරපුර වෙනුවෙන් එය සැලසුම් සහගත පූජා නගරයක් බවට පත් කිරීමටත් දූරදර්ශී මහජන නායකයකු හැටියට එතුමන් පියවර ගත්තේ ය.

බංඩාරකොස්වත්ත, දොතැල්ල, කොන්දෙණිය යන ස්ථානවල පොදුජන යහපත වෙනුවෙන් මහජන බෙහෙත් ශාලා ඉදිකිරීම මෙන්ම හොරොම්බුව ආයුර්වේද බෙහෙත් ශාලාව ඉදිකිරීම තුළින් ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීමට පියවර ගත්තේ ය.

මෙසේ සෑම අංශයකම දියුණුවට කටයුතු කර, "පඩුවස්නුවර රජ්ජුරුවෝ" නමින් විරුදාවලිය ලත් එතුමා අවුරුදු 88ක් ආයු වළඳා, 2014 දෙසැම්බර් මස 10 වන දින අප අතරින් සමු ගත්තේ ය.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස අවුරුදු 11යි මාස 4යි දින 29ක කාලයක් විශේෂයෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාවටත්, සමස්ත ශ්‍රී ලංකාවාසී ජනතාවටත් සුවිශාල සේවයක් කළ ආර්.එම්. කළුබණ්ඩා රත්නායක මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමි. මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමාගේ ආදරණීය දූ දරුවන් ඇතුළු ඥාතීන් වෙත දන්වා යවන ලෙස යෝජනා කරමි. ස්තුතියි.

[පූ.භා. 11.05]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී විපක්ෂයේ ප්‍රධාන සංවිධායක හැටියට මා එතුමන් ගැන යමක් කියන්න ඕනෑ. ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමා කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැරණි පවුලකින් පැවත එන නායකයෙක්. එතුමා කෘෂි කාර්මික කටයුතු ගැන විශේෂ උනන්දුවක් දැක්වූවා.

ඒ වාගේම පඩුවස්නුවර දළදා පෙරහැර පැවැත්වීම ආරම්භ කිරීම වැනි ශාසනික කටයුතු සිදු කළා. එතුමා පඩුවස්නුවර ප්‍රදේශය බෞද්ධ කලාපයක් කිරීමට අවශ්‍ය පියවර ගත්තා. විශේෂයෙන්ම එතුමා පාසල් ගණනාවක් ආරම්භ කළා. එම ප්‍රදේශයේ ජනතාවට බෙහෙත් ශාලා රාශියක් එතුමා ආරම්භ කළා.

එතුමාගේ first love එක වුණේ කෘෂිකර්මය. එතුමා කෘෂිකර්ම කටයුතු පිළිබඳ විශාල උනන්දුවක් දක්වා එම පළාත ස්වයංපෝෂිත කරන්න කටයුතු කළා. එතුමා අවුරුදු එකොළහක් පාර්ලිමේන්තුව නියෝජනය කළා. එතුමාගේ එක පුතෙක් මහ ඇමතිවරයකු හැටියට පත් වුණා. චූලා බණ්ඩාර රත්නායක මැතිතුමා අප සමඟ පාර්ලිමේන්තුවේ කටයුතු කළා. එතුමා ඒ කාලයේ ඉතාම උනන්දුවෙන් පාර්ලිමේන්තුවේ කටයුතුවලට සම්බන්ධ වුණු බව මට මතකයි.

අභාවප්‍රාප්ත ගරු ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමාගේ පවුලේ සියලුදෙනාටම මේ අවස්ථාවේදී එතුමාගේ අභාවය වෙනුවෙන් සංවේගය පළ කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු කථානායකතුමනි, ගරු සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාට අද දින නොවැළැක්විය හැකි හේතුවක් නිසා සභාවට එන්න බැරි බව මා හට දන්වා තිබෙනවා. එම නිසා එතුමා ආර්.එම්. කළුබණ්ඩා රත්නායක මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එවා තිබෙන ශෝක ප්‍රකාශය මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද කථාව:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரை:*
*Speech tabled:*

ඓතිහාසික පඩුවස්නුවර නියෝජනය කරමින් 1977 වසරේ පැවැති මහ මැතිවරණයෙන් ජනතා නියෝජිතවරයෙකු වශයෙන් පත්වීමේ වරම් ලැබීමට ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමා වාසනාවන්ත වුණා. ප්‍රදේශයේ ජනතාව තමා වෙත ලබා දුන් ඒ සුවිශේෂී වගකීම සිය කරමත තබා ගත් රත්නායක මැතිතුමා පඩුවස්නුවර වැසියන්ට රජෙක් බවට පත් වූයේ ඔහු තුළ පැවැති නිහතමානීභාවය නිසයි.

1926 අප්‍රේල් මස 04 වන දින ජන්ම ලාභය ලද එතුමා දෙවන ජාතික රාජ්‍ය සභාවේ සාමාජිකයෙකු වශයෙන් ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළමුවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු ලෙස ද පඩුවස්නුවර ආසනය නියෝජනය කළ අතර, වසර එකොළහමාරකට ආසන්න කාලයක් මහජන නියෝජිතයෙකු වශයෙන් රටට, ජාතියට හා ජනතාවට අප්‍රමාණ සේවයක් ඉටු කළ මා හැඟි යුග පුරුෂයෙකි.

ප්‍රදේශයේ කෘෂි කර්මාන්තය නඟා සිටුවීමට මෙන්ම කෘෂි කර්මාන්තය සිය ජීවන වෘත්තිය කර ගත් ප්‍රදේශයේ ජනතාවගේ උන්නතිය උදෙසා ද සිය කාලය හා ශ්‍රමය වැය කළ එතුමා දිවුල්වැව වෙල්යායේදී පැවැති වප්මඟුල් උළෙල පවත්වමින් කෘෂි කර්මාන්තය නඟා සිටුවීම සඳහා වූ සිය අධිෂ්ඨානය මෙන්ම අප්‍රතිහත ධෛර්යයද ප්‍රකට කළේ ය.

පෙර රජ දවස පඩුවස්නුවර වැඩ සිටි දළදා වහන්සේ වෙනුවෙන් දළදා පෙරහර පවත්වා තිබූ අතර, එය නැවත ආරම්භ කිරීමට රත්නායක මැතිතුමා විසින් දක්වන ලද දායකත්වය සිහිපත් කිරීම බෞද්ධ අපගේ යුතුකමක් සේ සලකමි. 1979 සැප්තැම්බර් මස රත්නායක මැතිතුමා විසින් නාහිමිවරුන්ගේ අවවාද අනුශාසනා මත දළදා පෙරහැර නැවත පවත්වන්නට කටයුතු කරන ලද අතර, එම පෙරහැර එතුමා විසින් නොකඩවා වසර දහතුනක්ම වාර්ෂිකව පැවැත්වූ බවට ප්‍රදේශවාසීන් සාක්ෂි දරනු ඇත.

රත්නායක මැතිතුමා වාරිමාර්ග හා කෘෂිකර්මය වෙනුවෙන් දැක්වූ අතිමහත් කැප කිරීම කොතෙක්ද යත්, පඩුවස්නුවර කොට්ඨාසයේ ඇති වැව් අමුණු හාරසියයකට ආසන්න සංඛ්‍යාවම පිළිසකර කිරීමේ කටයුතුවලට එතුමාගේ දායකත්වය හිමි වී තිබුණි. වයඹ පළාතේ වැව් ගැඹුරු කිරීමේ කටයුතු යන්ත්‍රානුසාරයෙන් සිදු කිරීම ආරම්භ කරන ලද්දේ රත්නායක මැතිතුමා විසිනි. එමෙන්ම රත්නායක මැතිතුමා ගොවි ජනතාවගේ යහපත වෙනුවෙන් ගොවිජන සේවා මධ්‍යස්ථාන ඉදිකරමින් ප්‍රදේශයට සිදු කරන ලද සේවාව අතිමහත් බව සිහිපත් කරමි.

දැයේ දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් නිරන්තරයෙන් කැප වී කටයුතු කළ එතුමා ප්‍රදේශයේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සිදු කළ සේවය අමරණීය බව අදත් සිහිපත් කිරීම එතුමාට කරනු ලබන උපහාරයක් සේ සලකමි.

බංඩාරකොස්වත්ත, කොළඹගම, කිරිමාටියාව, මදුල්ල, මඩිගේ විදියාල, ඇපලදෙණිය, කොස්දෙණිය ආදී විදුහල් මහා විදුහල් බවට පත් කරමින් එතුමා විසින් පඩුවස්නුවර දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ තලයට ඔසවා තැබීමට කටයුතු කරන ලදී.

මෙම අධ්‍යාපනික මෙහෙවර ඉදිරියට ගෙන යමින් රත්මුලුකන්ද සහ කනතලව විදුහල් ආරම්භ කරන ලද්දේ රත්නායක මැතිතුමා බව පවසන්නේ එතුමාට ගෞරවය හිමි කර දෙමිනි.

පෞරාණික පඩුවස්නුවර රජ දහන අනාගත පරපුර වෙනුවෙන් ද සුරැකීමට එතුමා දිවා රෑ නොබලා වෙහෙසී කටයුතු කළේ ය. ඒ වෙනුවෙන් පඩුවස්නුවර සැලසුම් සහගත පූජා නගරයක් බවට පත් කරමින් එම පෞරාණික පුරාවස්තු සුරැකීමට කටයුතු කිරීමේ මෙහෙය අමරණීය වේ.

එතුමාගේ සේවාව එක් අංශයකට පමණක් සීමා නොවූ බව ඉහත කරුණුවලින් පැහැදිලි වන අතර, රත්නායක මැතිතුමා ප්‍රදේශයේ සෞඛ්‍ය තත්ත්වය නැංවීම සඳහා කළ අනුපමේය මෙහෙය ද සිහිපත් කිරීම යුතුකමක් සේ සලකමි. බංඩාරකොස්වත්ත, දොතැල්ල, කොන්දෙණිය යන ස්ථානවල බෙහෙත් ශාලා ඉදිකරමින්, හොරොම්බුව ආයුර්වේද බෙහෙත් ශාලාව ඉදි කිරීම තුළින් එතුමා එම කාර්යය වෙනුවෙන් දක්වන ලද කැප කිරීම මනාව පෙන්නුම් කරයි.

කළ යුත්ත කෙසේ හෝ කිරීම එතුමාගේ සිරිතයි. ඕනෑම බැරෑරුම් ප්‍රශ්නයකට අභීතව නොසැලී සිහි බුද්ධියෙන් මුහුණ දීම එතුමාගේ ලක්ෂණයයි. තම පුරවැසියන්ට සුහදව, සිනාමුසුව, විහිළු තහළුවෙන් කතා බස් කිරීම එතුමාගේ සහජ ගතියක් වූ අතර, හිතවතාට උපරිම මට්ටමෙන් උදව් කිරීමට හැම විටම සූදානම්ව සිටියේ ය. එමෙන්ම සතුරාට පන්න පන්නා පහරදීම ද එතුමාගේ ගතියක් වූ බව සඳහන් කරන්නේ එතුමා තුළ පැවැති නිර්භීත බව පෙන්වා දීමටයි.

2014.12.10 වන දින අභාවප්‍රාප්ත වූ රත්නායක මුදියන්සේලාගේ කළුබණ්ඩා රත්නායක මැතිතුමා පුරා වසර 88කට අධික කාලයක් ආයු වින්දනය කළ අතර, සිය ප්‍රදේශයට මෙන්ම සමස්ත ජාතියටද ඉටු කළ සේවය සදානුස්මරණීය වන බව සිහිපත් කරමින්, එතුමා හට අජරාමර නිවන් සුව අත් වේවා! යි ප්‍රාර්ථනා කරමි.

එතුමාගේ අභාවය සිහිපත් කරන මේ අවස්ථාවේදී මෙම සභාවේ විපක්ෂ නායක වශයෙන් ද සමඟි ජන බලවේගයේ නායකයා වශයෙන් ද එතුමාගේ පවුලේ සැම වෙත මාගේ සාතිශය සංවේගය පළ කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

[පූ.භා.11.07]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa)

ගරු කථානායකතුමනි, අපේ පළාතේ, අපට පෙර දීර්ඝ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කළ ගරු ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමාගේ ශෝක ප්‍රකාශ යෝජනාවට අදාළව අදහස් දක්වන මේ අවස්ථාවේ මටත් එතුමා සම්බන්ධව වචන කිහිපයක් ප්‍රකාශ කිරීමට හැකිවීම ගැන සන්තෝෂ වෙනවා. ගොවිතැන කේන්ද්‍රගත වුණු ප්‍රදේශයක් වන අපේ පළාතෙන් මන්ත්‍රීවරයකු වශයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වූ එතුමා දශකයකට වැඩි කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඒ කාලය තුළ එතුමා එම පළාතේ දියුණුව වෙනුවෙන් ඉතා විශාල සේවාවක් කළා. එවකට එනම්, 1977 වෙනකොට පඩුවස්නුවර ආසනය අලුතින් නිර්මාණය වූ ආසනයක්. ඒ ආසනය තුළ විශාල අඩුපාඩුකම් තිබුණා. ඒවා බොහෝ දුරට නිරාකරණය කරන්න ඒ කාලයේ හැටියට එතුමා විශාල මෙහෙයක් දැරුවා. අපි ඒක පෞද්ගලිකව දන්නවා.

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

එතුමා ඉතාම හොඳ ගොවියෙක් වාගේම හොඳ පියෙක්. තමන්ගේ දරුවන්ට ඉතාම ඉහළ අධ්‍යාපනයක් ලබා දෙන්නට එතුමා විශාල වශයෙන් මහන්සි වුණා. එතුමාගේ පවුලේ සියලුදෙනාම මම පෞද්ගලිකව හඳුනනවා. විශේෂයෙන්ම අපේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වූල බණ්ඩාර රත්නායක මැතිතුමා, හිටපු මහ ඇමති නැසී ගිය නිමල් බණ්ඩාර රත්නායක මැතිතුමා, වෛද්‍ය ධම්මික රත්නායක මැතිතුමා -ඔහු අප සමඟත් නීති විද්‍යාලයේ වසරක් පමණ ගත කළා- ඒ වාගේම මේජර් ජෙනරල් ජනක රත්නායක මැතිතුමා, තෙන්නකෝන් මැතිනිය සහ දියණිය ඇතුළු සියලුදෙනාම අපි ඉතා හොඳින් හඳුනනවා. අපි කණ්ඩායම් දෙකක හිටියත් හැම විටම මිත්‍රත්වය, සහයෝගය එක්ක තමයි අපේ දිස්ත්‍රික්කයේ දේශපාලනය කළේ. මම දේශපාලනය ආරම්භ කරන අවස්ථාවේ කළුබණ්ඩා රත්නායක මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් සමුගෙන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් වැඩ කළා. නමුත් එතුමාගේ දරුවන් එක්ක අපි දීර්ඝ කාලීන සබඳතා පවත්වා තිබෙනවා. අපේ පළාතේ ඉතාම වැදගත් පවුලක, ඉතාම හොඳ සේවයක් කරපු තේජාන්විත පුරුෂයෙක් තමයි නැසීගිය කළුබණ්ඩා රත්නායක මැතිතුමා. එතුමා කරපු සේවාව පිළිබඳව දැන් ඇගයීමක් කළා. මම හිතන හැටියට ඒවා ඒ යුගයේ විශාල වැඩ. අද නම් ඒවා එතරම් ලොකු වැඩ නොවුණත්, ඒ යුගයේ එවකට ආණ්ඩුවකින් ලබාගන්න පුළුවන් උපරිමය එතුමා තමන්ගේ ආසනයට ලබා ගන්න ක්‍රියා කළා. විශේෂයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඩුවස්නුවර ආසනයේ තමයි වැඩිපුරම වැව් තිබෙන්නේ. මම හිතන විධියට වැව් 500කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. ඒවා ඉතාම හොඳින් නඩත්තු කිරීමට එතුමා විශාල මහන්සියක් ගත්තා. අපේ ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට එතුමාගේ අභාවය ගැන මගේ ශෝකය පළ කරමින් එතුමාට නිවන් සුව අත්වේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

[පූ.භා.11.10]

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු කථානායකතුමනි, පඩුවස්නුවර ආසනයෙන් 1977 එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කළ ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී එතුමාගේ පවුල සමඟ සමීප සම්බන්ධතා පැවැත්වූ පවුලක කෙනකු විධියට මේ අවස්ථාවේ එතුමා වෙනුවෙන් ශෝකය පළ කිරීමට ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. විශේෂයෙන්ම කළුබණ්ඩා රත්නායක මැතිතුමා මගේ පියා සමඟ ඉතාම සමීපව ආශ්‍රය කළ කෙනෙක්. මගේ පියා පඩුවස්නුවර ආසනයට සම්බන්ධ නැති වුණත්, මගේ පියා 1950දී තමයි ගාල්ල ප්‍රදේශයේ සිට කුරුණෑගල ප්‍රදේශයට පැමිණියේ. ඒ කාලයේ සිට කළුබණ්ඩා රත්නායක මැතිතුමා සමඟ අපේ පියාගේ සම්බන්ධතාව මා කුඩා දරුවකු කාලෙයේ හොඳින් දැක්කා. එවකට වාරියපොළ ආසනය තමයි තිබුණේ. පඩුවස්නුවර කොට්ඨාසය, පඩුවස්නුවර විධියට නොවෙයි, හෙට්ටිපොළ විධියටයි හැඳින්වුයේ. එය හෙට්ටිපොළ ගම් සභාව.

1977දී නව පඩුවස්නුවර ආසනය බිහි කිරීමට ප්‍රථම අංක 100, වාරියපොළ ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක ධුරයට එතුමා පත් වුණා. එම සංවිධායක ධුරය ලබා දෙන අවස්ථාවේ මාත් කුඩා දරුවකු විධියට මගේ පියාත් සමඟ කොල්ලුපිටියේ පිහිටි සිරිකොත මධ්‍යස්ථානයට ගියා. වාරියපොළ ආසනයේ එක්සත් ජාතික පක්ෂ සංවිධායක ධුරය ලබා ගැනීම සඳහා පැවැති රැස්වීම්වලදී වාරියපොල ආසනය සඳහා සංවිධායකවරුන් පස්දෙනෙක් තෝරා ගත්තා. එම පත් කිරීමේදී එතුමා පස්වැනි ස්ථානයට පත් වුණා. මට මතකයි එච්.බී. අබේරත්න මැතිතුමා ඒ අවස්ථාවේදී කිව්වා, "පළමුවැනියාට සංවිධායක ධුරය හම්බ වෙයිද, පස්වැනියාට හම්බ වෙයිද දන්නේ නැහැ" කියලා. ඒ වාගේම, පස්වැනි ස්ථානයට තේරුණු ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමාට වාරියපොල ආසනයේ සංවිධායක ධුරය ලැබුණා.

ඉන් පසුව සීමා නිර්ණය කොමිෂන් සභාව හරහා පඩුවස්නුවර ආසනය සහ ගල්ගමුව ආසනය කුරුණෑගල දිස්ත්‍රික්කයට අලුතින්ම එකතු වුණාට පසුව, එතුමා පඩුවස්නුවර ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා වශයෙන් පත් වෙලා, 1977දී පඩුවස්නුවර ආසනය එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කළා.

එතුමා අපේ නිවසට නිතර නිතර පැමිණියා. අපි එම පවුලේ අය සමඟත් ඉතා සමීපව ආශ්‍රය කළා. මගේ පියා හෙට්ටිපොළ ගම්සභාවේ හෙට්ටිපොළ කොට්ඨාසය නියෝජනය කරන විට, කළුබණ්ඩා රත්නායක මැතිතුමා මණ්ඩපොල, දිගේගෙදර කොට්ඨාසය නියෝජනය කරමින් ගම්සභාවට පත් වෙලා, එහි සභාපතිවරයා බවටත් පත් වුණා. ඊට පසුව එතුමා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා බවට පත් වුණා. පාර්ලිමේන්තුවෙන් සමුගත් පසුව තමයි එතුමා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා බවට පත් වුණේ.

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ ප්‍රසිද්ධියට පත් වූ පළමු වප් මඟුල් උත්සවය පඩුවස්නුවර ආසනයේ, හෙට්ටිපොළදී ආරම්භ කළේ රත්නායක මැතිතුමාගේ මූලිකත්වයෙන්. ඒ වාගේම, එතුමා පඩුවස්නුවර ආසනයට විශාල සේවයක් කළා. එතුමාට දරුවන් එකොළොස් දෙනෙක් හිටියා. ඉන් එක් අයෙක් වන නිමල් බණ්ඩාර මැතිතුමා වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා බවට පත් වුණා. එතුමා අසනීප තත්ත්වයක් මත හදිසියේ අභාවප්‍රාප්ත වුණා. තවත් දරුවකු වන වූල බණ්ඩාර මැතිතුමා මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කළා. එතුමා පඩුවස්නුවර ආසනයෙනුත්, ජාතික ලැයිස්තුවෙනුත් පත් වුණා.

විශේෂයෙන්ම, ආරම්භයේ සිට පඩුවස්නුවර ප්‍රදේශයට, ඒ මැතිවරණ කොට්ඨාසයට ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමා විශාල සේවයක් කළා. පඩුවස්නුවර ආසනයේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට, අධ්‍යාපන ක්ෂේත්‍රයට වාගේම, අනෙකුත් සමාජ සේවාවලදීද පක්ෂ භේදයකින් තොරව එතුමා විශාල සේවාවක් ඉටු කළ බව අපි කවුරුත් දන්නවා. අපේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමා පැවසූ පරිදි එතුමා හැඳින්වූයේ, "රජ්ජුරුවෝ" කියලායි. එතුමා ඒ ප්‍රදේශයේ සිටි ඉතා ප්‍රතාපවත් පුද්ගලයෙක්.

ඒ පවුලේ සියලුදෙනාම සමීපව ආශ්‍රය කළ පවුලක කෙනකු විධියට මම එතුමාට නිවන් සුව පතනවා. එතුමාගේ ආදරණීය බිරිඳත් මෑතකදී අභාවප්‍රාප්ත වුණා. එතුමියට නිවන් සුව පතන්නත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

කළුබණ්ඩා රත්නායක මැතිතුමාගේ පුත් නිමල් බණ්ඩාර මැතිතුමා වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍ය තනතුරට පත් වෙලා සිටියා. එතුමාත් අභාවප්‍රාප්ත වුණා. එතුමාගේ අභාවය පිළිබඳත් අපේ සමඟි ජන බලවේගයේ ශෝකය ප්‍රකාශ කරනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මම කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමඟි ජන බලවේගයේ සියලුදෙනාගේ ශෝකය ගරු කළුබණ්ඩා රත්නායක මැතිතුමාගේ පවුලේ සාමාජිකයන්ට පළ කිරීමට මෙය අවස්ථාවක් කරගන්නා අතර, අභාවප්‍රාප්ත කළුබණ්ඩා රත්නායක මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

[පූ.භා.11.15]

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අද අපි මේ ශෝක යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ ආර්.එම්.කේ.බී. රත්නායක මහතා අභාවප්‍රාප්ත වී අවුරුදු පහකට පසුවයි. 2014 වර්ෂයේදී තමයි එතුමා අභාවප්‍රාප්ත වුණේ. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කළුබණ්ඩා රත්නායක මැතිතුමා ග්‍රාමීය ජනතාවට නායකත්වය දෙමින් විශාල සේවයක් කළ දේශපාලනඥයෙකු වූ බව මම විශේෂයෙන්ම මතක් කරන්න කැමතියි.

එතුමා අවුරුදු 11ක් එක දිගට පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඒ අවුරුදු 11 තුළ හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ නායකත්වය යටතේ එතුමා පඬුවස්නුවර රාජධානිය ආරක්ෂා කරමින්, පඬුවස්නුවරට දැවැන්ත සේවයක් සිදු කළා. දේශපාලනඥයකු හැටියට එතුමා හදපු පාසල ලංකාවටම ආදර්ශවත් පාසලක් කියායි මා හිතන්නේ. පඬුවස්නුවරට යන හැම අවස්ථාවේම මම ඒ පාසල දකිනවා. ඒ පාසල දැක්කාම මට හිතෙනවා, ඒ වාගේ පාසල් ලංකාවේම නිර්මාණය වුණා නම් කොච්චර ලස්සනද, එමගින් අධ්‍යාපනයට මොන වාගේ ඉහළ තත්ත්වයක් ලැබෙයිද කියලා.

එතුමා අපේ දිස්ත්‍රික්කයේ දේශපාලනඥයකු හැටියට කොන්ද කෙළින් තියාගෙන වැඩ කටයුතු කළ මන්ත්‍රීවරයෙක්. ඒ නිසා එතුමාට දේශපාලනමය වශයෙන් විශාල කැපිලිවලට මුහුණ දෙන්න සිද්ධ වුණාය කියන එක අමුතුවෙන් මතක් කරන්න දෙයක් නොවෙයි.

ගරු කළුබණ්ඩා රත්නායක මැතිතුමාගේ දරුවෝ මේ රටට විශාල සේවයක් කරන පිරිසක්. ඒ අතර විදුහල්පතිවරියක්, වෛද්‍යවරයෙක්, මහ ඇමතිවරයෙක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් -ගරු වූල බණ්ඩාර මැතිතුමා- සිටිනවා. ඒ වාගේම, අපේ පාසලේ අතුල රත්නායක මහත්මයාත් මතක් කරන්න ඕනෑ. එතුමා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්. මේජර් ජෙනරාල් ජනක රත්නායක මහත්මයා රට වෙනුවෙන් තමන්ගේ යුතුකම් ඉටු කළ ශ්‍රේෂ්ඨ නිලධාරියෙක්. කළුබණ්ඩා රත්නායක මැතිතුමාගෙන් පසුව -රජ්ජුරුවන්ගෙන් පසුව- එතුමාගේ දේශපාලන ගමන ඉදිරියට ගෙන යෑමේ වගකීම බාරගත්තේ ගරු වූල බණ්ඩාර මැතිතුමායි.

එතුමා දේශපාලන වශයෙන් විතරක් නොවෙයි, නීතිය අංශයෙනුත් දැවැන්ත සහයෝගයක් එදා එක්සත් ජාතික පක්ෂයට ලබා දුන්නාය කියන එක, එක්සත් ජාතික පක්ෂයට කවදාවත් අමතක කරන්න බැරි වෙයි කියා මා හිතනවා. ඒ වාගේමයි, කළුබණ්ඩා රත්නායක මැතිතුමාගේ පුත්‍රයකු වන හිටපු මහ ඇමතිවරයකු වූ නිමල් බණ්ඩාර මැතිතුමාත්. එතුමාත් මාත් එකම පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ සිටියා. එතුමාත් බොහොම නිහතමානි දේශපාලනඥයෙක්. එතුමා පළාත් සභාව තුළින් දිස්ත්‍රික්කයේ ජනතාවට, පළාතේ ජනතාවට විශාල සේවයක් කළාය කියන එක අපට කවදාවත් අමතක කරන්න බැහැ.

ගරු කථානායකතුමනි, ගරු කළුබණ්ඩා රත්නායක මැතිතුමාගේ පවුල සුවිශේෂී පවුලක්. මා කලිනුත් කිව්වා වාගේ "රජ්ජුරුවෝ" යන නාමයෙන් හැඳින්වූ කළුබණ්ඩා රත්නායක මැතිතුමා මහා කළු සිංහලයා වාගේ තමයි කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිටියේ. එතුමා දිස්ත්‍රික්කයේ කිසිම දේශපාලනඥයකුට ඔළුව නැමුවේ නැහැ. එතුමා එතුමාට ඕනෑ දේ එතුමාගේ ජනතාව වෙනුවෙන් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මෙම අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු නිමල් ලාන්සා මහතා (ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் லான்சா - கிராமிய வீதிகள் மற்றும் ஏனைய உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Nimal Lanza - State Minister of Rural Roads and Other Infrastructure)

ගරු කථානායකතුමනි, "ගරු වීරසුමන වීරසිංහ මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. WEERASUMANA WEERASINGHE took the Chair.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කළුබණ්ඩා රත්නායක මන්ත්‍රීතුමාට වාසනාව ලැබුණා, එදා හිටපු ජනාධිපතිතුමා ගෙන්වා පළමුවන වප් මඟුල පඬුවස්නුවරදී උත්සවාකාරයෙන් පවත්වන්න. ඒ නිසා එතුමාට කථාවකුත් නිර්මාණය වුණා, "හිටපු ජනාධිපතිතුමාට අමුඩය ගැස්වූ මන්ත්‍රීතුමා" කියලා. ඒ පළාතේ අය එහෙම කථා වෙනවා. කළුබණ්ඩා රත්නායක මන්ත්‍රීතුමා පඬුවස්නුවර ආසනයේ ජනතාවට මෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාවටත් කවදාවත් අමතක කරන්න බැරි චරිතයක්. එතුමා භය වුණේ නැහැ; නිර්භීතව තීන්දු තීරණ ගත්තා. එතුමා ජනතාව වෙනුවෙන් නිර්භීත තීන්දු තීරණ අරගෙන වැඩ කටයුතු කරපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් කියන එක මා මේ වෙලාවේදී මතක් කරනවා.

ඒ විතරක් නොවෙයි. පඬුවස්නුවර පෞරාණිකත්වය ආරක්ෂා කරමින්, එය පූජා නගරයක් බවට පත් කිරීමටත් එතුමා කටයුතු කළාය කියන එක අපට අමතක කරන්න බැහැ. රෝහල්, පාසල් හා විවිධ රාජ්‍ය ආයතන දියුණු කරමින් එතුමා කටයුතු කළා කියන

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

එකත් මා මේ අවස්ථාවේදී ගෞරවයෙන් මතක් කරනවා. මගේ ශෝකය ගරු කළුබණ්ඩා රත්නායක මැතිතුමාගේ පවුලේ ඥාතීන් වෙත මේ වෙලාවේ පුද කරමින්, ගරු කළුබණ්ඩා රත්නායක මැතිතුමාට නිවන් සුව අත් වේවායි මම ප්‍රාර්ථනා කරනවා.

[පූ.භා.11.20]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන මහජන නියෝජිතයකු විධියටත්, ඒ වාගේම, දිවංගත කළුබණ්ඩා රත්නායක මැතිතුමා නියෝජනය කළ ආසනයට යාබද ආසනය වන බිංගිරිය ආසනයේ සංවිධායකවරයා විධියටත්, එතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කරමින් වචන කිහිපයක් කථා කරන්න ලැබීම ගැන මම එක්තරා විධියකට සතුටු වෙනවා. එතුමා අභාවප්‍රාප්ත වුණේ 2014.12.10වෙනි දා.

කළුබණ්ඩා රත්නායක මැතිතුමා ගැන අපේ ප්‍රදේශයේ ජනතාව අතර තිබෙන්නේ බෙහෙවින් සතුට දනවන මිහිරි මතකයක්; ඒ වාගේම ගෞරවයක්. ඊට හේතුව, එතුමා අවුරුදු 12කට ආසන්න කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කිරීම සහ ඉන් එපිටත්, ඉන් පසුවත් තමන්ගේ ප්‍රදේශයට වැඩ කරපු මහජන නියෝජිතයකු වීමයි. එතුමා බෙහෙවින් ප්‍රසිද්ධ වන්නේ "පඬුවස්නුවර රජ්ජුරුවෝ" යන නාමයෙන්. පඬුවස්නුවර කියන්නේ අපේ රටේ ඓතිහාසික භූමියක්. එය දළ දා වහන්සේත් වැඩ සිටි ප්‍රදේශයක් යැයි ජන ප්‍රවාදයේ තිබෙනවා. ඒ වාගේම, එය යුව රජතුමකු හිටපු නටබුන් සහිත, පුරාවස්තු තිබෙන බොහොම වටිනා ප්‍රදේශයක්. "පඬුවස්නුවර රජ්ජුරුවෝ" කියන අභිමානය එතුමා තුළ තිබුණා. එම අභිමානය සැබවින්ම එතුමාට හිමි විය යුතු දෙයක් ලෙස මා දකිනවා.

එතුමා කෘෂි කර්මාන්තයට දැක්වූ උනන්දුව, කෘෂි කර්මාන්තය වෙනුවෙන් කරපු කැපකිරීම ඉතා විශාලයි. එතුමා පඬුවස්නුවර ආසනය තුළ වැව් 400කට වැඩි ප්‍රමාණයක් සංවර්ධනය කරලා තිබෙනවා; වැඩි දියුණු කරලා තිබෙනවා. එතුමා අලුත් වැව් කිහිපයකුත් හදලා තිබෙනවා.

එතුමා පඬුවස්නුවර අධ්‍යාපනයට කරපු සේවය ගැනත් කියන්න ඕනෑ. බණ්ඩාරකොස්වත්ත, කොළඹගම, කිරිමැටියාව, මදුල්ල, මඩිගෙ මිදියාල, ඇපලදෙණිය, කොස්දෙණිය ආදි විදුහල් මහා විද්‍යාල බවට පත් කරන්න එතුමා විශාල වැඩ කොටසක් කළා. ඒ වාගේම එතුමා රත්මුලුකන්ද සහ කනතලව අලුතින් පාසල් දෙකක් ආරම්භ කළා. මේ විධියට පඬුවස්නුවර ආසනයේ ජනතාවට අමතක නොවන සේවයක් කරපු කෙනෙකු ලෙස ගරු කළුබණ්ඩා රත්නායක මැතිතුමා හඳුන්වන්න පුළුවන්. එතුමා ගමේයි ජීවත් වුණේ. එතුමා අවසන් හුස්ම හෙළුවේ එතුමාගේ නිවසේ. ගම දාලා නොගිය, තමන්ගේ අවසාන කාලයේත් ජනතාව අතර ජීවත් වූ කෙනකු හැටියට එතුමා හඳුන්වන්න පුළුවන්.

එතුමාගේ දරුවන් ගැනත් කියන්න ඕනෑ. විශේෂයෙන්ම නීතිඥ ගරු ආර්.එම්. චූල බණ්ඩාර මැතිතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. ආර්.එම්. නිමල් බණ්ඩාර මැතිතුමා වයඹ පළාත් සභාවේ හිටපු මහ ඇමතිවරයකු විධියට ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමාගෙන් පසුව වයඹ පළාතේ නොමැකෙන සේවයක් කළා. ඒ ගෞරවය හැම දාමත් ඒ පවුලට හිමි වනවා. යුද හමුදාව නියෝජනය කරන්න තමන්ගේ දරුවෙකු දායාද කරන්න එතුමාට පුළුවන් වුණා. ඒ අනුව බැලුවාම, එතුමාගේ පවුල ප්‍රදේශයේ ගෞරවනීය පවුලක්. පඬුවස්නුවරට විතරක් නොවෙයි, ඒ පළාතටම බොහොම ගෞරවයක් ගෙන දුන් චරිතයක් විධියට අපට එතුමා හඳුන්වන්න පුළුවන්.

එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරපු කාලයේ පාර්ලිමේන්තුවේ කරපු හැම කථාවකදීම පඬුවස්නුවර සංවර්ධනය ගැන සඳහන් කළා. එතුමා රජය නියෝජනය කරපු මන්ත්‍රීවරයකු විධියට සිටියත්, රජයේ අඩු පාඩු හා අසාධාරණකම් ගැන කථා කළ බවට සටහන් තිබෙනවා. විශේෂයෙන්ම 1979.12.13 හැන්සාඩ් වාර්තාවේ සඳහන්ව තිබෙනවා, වැවිලි සංස්ථාව හා පොල් කර්මාන්තය පිළිබඳ එතුමා කළ කථාව. එදා එතුමා බොහොම පැහැදිලිව කියපු කාරණයක් තිබෙනවා. එදා එතුමා කළ කථාවෙහි ඇතුළත් එම කොටස එතුමාට කරන ගෞරවයක් විධියට එතුමාගේ වචනයෙන්ම මා උපුටා දක්වන්නම්. එහි මෙසේ සඳහන් වනවා:

> "ඊළඟට ජනවසම ගැන මගේ කණගාටුව හා අප්‍රසාදය පළ කරන්න ඕනෑ. මගේ ආසනයේ තිබෙනවා, 'මොහොත්තෝ ගොඩ වත්ත' කියා අක්කර 103ක වත්තක්. ඩග්ලස් පෙරේරා කියන මහත්මයෙකුටයි එය අයිතිව තිබුණේ. ඔහු කවුද කියා තමුන්නාන්සේලා දන්නවා ඇති. ඔහු මොන පක්ෂයෙන් ද, ඔහුගේ දේශපාලන සම්බන්ධකම් මොනවාද කියා මා කියන්න වුවමනාවක් නැහැ. ගිය ආණ්ඩුවෙන් තමාට අසාධාරණකම් කර තිබෙනවා කියා ඔහු ඒ වත්තෙන් අක්කර 50ක් ඉල්ලා සිටියා. කෙසේ හෝ මා එයට විරුද්ධ වුණා..."

මේ ආකාරයට එතුමා තමන්ගේ ප්‍රදේශයේ ජනතාවගේ පැත්ත තමයි ගත්තේ. ඒකයි මා මේ කොටස මෙහිදී උපුටා දක්වන්න හේතුව වුණේ. එතුමා ජනතාවගේ පැත්ත අරන් හැම දාමත් ජනතාව වෙනුවෙන් තීන්දු තීරණ ගත්ත නායකයෙක්.

ඒ වාගේම, එතුමා පරිසරය ගැනත් විශාල අවධානයක් යොමු කර තිබෙන බවක් මෙම කථාවෙහිම එක් තැනක සඳහන් වන කාරණයකින් පැහැදිලි වනවා. මම ඒ කොටසත් උපුටා දක්වන්න කැමැතියි. එහි මෙසේ සඳහන් වනවා:

> "අවුරුද්දක් ගත වී පිදෙන්න ඔන්න මෙන්න කියා තිබුණු අඹ පැළ 100ක් ඒ ඉඩමේ තිබුණා. ඒ සියයම ගලවා ගෙන ගිහින්..."

මේ අනුව බැලුවාම, බොහොම සංවේදී නායකයකු විධියට, ජනතාවට සමීප වූ නායකයකු විධියට ගරු ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමා හැඳින්වූවහොත්, එය නිවැරදියි කියා මා විශ්වාස කරනවා. විශේෂයෙන්ම වර්තමානයේ කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට මා ගරු රත්නායක මුදියන්සේලාගේ කළුබණ්ඩා රත්නායක මැතිතුමා කරපු සේවයට අපේ දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් මගේ ගෞරවය එතුමාට පුද කරනවා.

එතුමා සදා නොමැකෙන සිහිවටන එක් කරපු නායකයෙක්. එතුමා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා 1978 අවුරුද්දේ තමන්ගේ ආසනයේ වප් මඟුල් උත්සවයට ගෙන්වා, ඒ වප් මඟුල් උත්සවයේදී ගොවි ඇඳුම -අමුඩය- අන්දවා, වෙලට බස්වා, සී සාන්න සැලැස්වූවා. ඒ ආකාරයට ජේ.ආර්. ජයවර්ධන රජයේ ඒ ඓතිහාසික පළමු වප් මඟුල පැවැත්වීමේ ගෞරවය එතුමා හිමි කරගත්තා. ඒ නිසා ගොවි රජෙක් හැටියට එතුමා සැමදාමත් වයඹ ජනතාවගේ හදවතේ ඉන්නවාය කියන එක මතක් කරමින්, එතුමාට මගේ ගෞරවය පුද කරනවා. ඒ වාගේම එතුමාගේ භවගාමී ජීවිතයට යහපතක්ම වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

[පූ.භා. 11.27]

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් අවසරයි. අද දින ශෝක ප්‍රකාශ යෝජනාව තිබෙන්නේ රත්නායක මුදියන්සේලාගේ කළු බණ්ඩා රත්නායක මැතිතුමා පිළිබඳවයි. එහෙම නැත්නම්, ආර්.එම්. කළු බණ්ඩා රත්නායක මැතිතුමා පිළිබඳවයි. එතුමා එකල ප්‍රසිද්ධියට පත් වුණේ "රජ වැඩ කළ පඩුවස්නුවර රජ්ජුරුවෝ" වශයෙන්. එතුමා දේශපාලනයට පිවිස 1958 වන විට හෙට්ටිපොළ ගම් සභාපති වුණා. ඉන් අනතුරුව දෙවන ජාතික රාජ්‍ය සභාව නියෝජනය කරන්න එතුමා 1977 අගෝස්තු 4වැනි දා පත් වුණා. දෙවන ජාතික රාජ්‍ය සභාව පළමුවැනි පාර්ලිමේන්තුව බවට පත් වෙනවා, 1978 සැප්තැම්බර් මස 7වැනි දා. දෙවන ජාතික රාජ්‍ය සභාවේ අවුරුදු එකකුත්, මාස එකකුත්, දින 16ක් ගත කරන එතුමා, ඉන් අනතුරුව පළමුවන පාර්ලිමේන්තුව තුළ අවුරුදු 10කුත්, මාස 3කුත්, දින 13ක් ඒ ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට දායකත්වය දක්වනවා. මීට පෙර දක්වපු ආකාරයට 1977 වර්ෂයේදී දිවුල්වැව වෙල්යායේදී පවත්වපු වප්මඟුල් උත්සවය සුවිශේෂී උත්සවයක් වුණා. රාජ්‍ය නායකයන් සහභාගි වෙලා කළ ඒ වප්මඟුල් උත්සවය හුදු උත්සවයකට සීමා වුණේ නැහැ. වප්මඟුල් උත්සවයකට පස්සේ ඊළඟ උත්සවය වන්නේ 'රන් කරල්' උත්සවයයි. 1977 වප්මඟුල් උත්සවය පවත්වලා ඉතාම සාර්ථක ලෙස එතුමාට පුළුවන් වුණා, 1978දී ඒ රන් කරල් උත්සවය පවත්වන්න. පඩුවස්නුවර කියන්නේ පෙර රජ දවසේ රාජධානියක්. ඒ රාජධානියේ ශ්‍රී දළදාව තිබුණාය කියන විශ්වාසය මත, ඒ ඓතිහාසික සාධක මත එතුමා 1979 සැප්තැම්බර් මාසයේදී දළ දා පෙරහැර ආරම්භ කරලා, අවුරුදු 13ක් එකී කාර්යය දිගටම කරගෙන යන්න එතුමාට හැකියාව ලැබුණා.

එතුමා වාරිමාර්ගය සහ කෘෂි කර්මාන්තයට විශාල දායකත්වයක් ලබා දුන් කෙනෙක්. පඩුවස්නුවර වැව් අමුණු 500 ගණනක් තිබුණා. එතුමා ඒ සියල්ලම පිළිසකර කළා කිව්වොත් නිවැරදියි. වයඹ පළාතේ වැව් යන්ත්‍රානුසාරයෙන් ගැඹුරු කරලා, ඒවා නැවත සැකසීම ආරම්භ කළේ අපේ හිටපු කළු බණ්ඩා මන්ත්‍රීතුමාය කිව්වොත් නිවැරදියි. ඒ වාගේම එතුමා පඩුවස්නුවර ගොවිජන සේවා මධ්‍යස්ථානය ඉදි කරන්නට නායකත්වය දුන්නා. දැනට නටබුන්ව පවතින, පැරකුම් රජ සමයේ ඉදි කළ පඬාවැව පිළිසකර කරන්නට උත්සාහයක් දැරුවත් එය ඉෂ්ට කර ගන්නට එතුමාට බැරිව ගියා.

එදා, 1956 එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති කළ ඒ වෙනස තුළ, සිංහල භාෂාවෙන් අධ්‍යාපනය ලබා දිය යුතුයි කියලා ගන්නා ලද ඒ තීරණය තුළ -අද නොයෙකුත් විවේචන කළාට- අධ්‍යාපනය ලබා ගන්න බැරි බොහොමයක් දෙනෙකුට එදා අධ්‍යාපනයේ දොරගුළු විවර වුණා. අද වෙනකොට අපේ රටේ සාක්ෂරතාව සියයට 98ක්වෙලා තිබෙනවා. අද අපට භාෂා මාධ්‍යය වෙනස් කරලා, අධ්‍යාපනය අතිනුත් ඉස්සරහට යන්න පුළුවන් හැකියාවක් ලැබිලා තිබෙනවා. කොහොම වුණත් එදා, 1956දී ඒ අධ්‍යාපන වෙනස ඇති කළාට, 1977න් පසු තවදුරටත් තමන්ගේ ප්‍රදේශයේ දරුවන්ගේ අධ්‍යාපනයේ දියුණුවක් ඇති කරන්නට කළුබණ්ඩා මන්ත්‍රීතුමා සුවිශාල දායකත්වයක් ලබා දුන්නා. විශේෂයෙන්ම, එතුමා බණ්ඩාරකොස්වත්ත, කොළඹගම, කිරිමැටියාව, මදුල්ල, මඩිගෙ මිදියාල, ඇපලදෙණිය, කොස්දෙණිය වාගේ විද්‍යාල මහා විද්‍යාල බවට පත් කළා. ඒ වාගේම, රත්මුලුකන්ද, කනතලව විදුහල් එතුමා විසින් ආරම්භ කළ විදුහල්. එක කාලයක මහා විද්‍යාල ඇති කරන්නට හැකියාවක් තිබුණේ නැහැ. හැබැයි, ඒ කාලයේත් පැරණි රජ මැඳුරට යාව පඩුවස්නුවර මහා විද්‍යාලය ඉදි කරන්නට තරම් කළුබණ්ඩා මන්ත්‍රීතුමා දක්ෂ වුණා. පඩුවස්නුවර පෞරාණිකත්වය සුරකිමින් සැලසුම් සහගත පූජා නගරයක් ඇති කරලා, පඩුවස්නුවර කියන නගරය මේ රටේ ඓතිහාසික නගරයක් විධියට ස්ථාපිත කරන්නට එතුමා විශාල දායකත්වයක් දැක්වූවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා තම පුරවැසියන්ගේ සෞඛ්‍ය තත්ත්වය දියුණු කරන්නට බණ්ඩාරකොස්වත්ත, දෙතැල්ල, කෝන්දෙණිය වාගේ ස්ථානවල බෙහෙත්ශාලා ඇති කළා. හොරොම්බුව ආයුර්වේද බෙහෙත්ශාලාව එතුමාගේම මුලිකත්වයෙන් ජනතාවට ලබා දුන්නු බෙහෙත් ශාලාවක් කිව්වොත් නිවැරදියි.

රත්නායක මුදියන්සේලාගේ කළුබණ්ඩා මන්ත්‍රීතුමා පැහැදිලිවම පාර්ලිමේන්තුව තුළ අවශ්‍ය කටයුතුවලට දිගින් දිගටම මැදිහත් වූ නායකයෙක්. එතුමා අසාධාරණයට විරුද්ධව නොපැකිළව කථා කළ නායකයෙක්. ඒක මනාව පිළිබිඹු වනවා 1979.12.22 දින එවකට ආහාර හා සමුපකාර අමාත්‍යාංශය යටතේ පැවැති විවාදයට සහභාගි වෙමින් එතුමා ඉදිරිපත් කළ කරුණු කාරණා තුළින්. එතුමා එහිදී පැහැදිලිව පෙන්වා දුන්නා, සමුපකාරයේ ඇති වන අක්‍රමිකතාවලට සම්බන්ධ ඕනෑම අයකුට එරෙහිව දැඩි දඬුවම් ලබා දිය යුතු බව. එතුමා නියෝජනය කළ ආණ්ඩුව තුළ සිටිමින්ම එතුමා සාධනීය විවේචන ඉදිරිපත් කළා.

ඒත් එක්කම වැවිලි සංස්ථාව හා පොල් කර්මාන්තය පිළිබඳ 1979.12.13 දින කරන ලද කථාව ඇතුළු සෑම කථාවක්ම දුප්පත්, දුගී ජනතාව වෙනුවෙන් කළ කථා කළ බව මනාව පිළිබිඹු වෙනවා. අද වන විට එතුමා මිය ගොස් අවුරුදු හයකට ආසන්න කාලයක් වෙනවා. අපි තවමත් ගරු ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමා කළ දේවල් ගැන කථා කරනවා. අලුතින් පාර්ලිමේන්තුවට පැමිණි අපටත් එතුමා තුළින් ඉගෙන ගන්න දෙයක් තිබෙනවා. ඒ තමයි අපි මේ රටේ ජනතාවට දැනෙන දෙයක් ඉටු කරන්න ඕනෑය කියන එක. එතකොට තමයි අපි ගැනත් යමක් කථා කරන්න පුළුවන් වෙන්නේ. හැබැයි, ඒ යුතුකම ගරු රත්නායක මුදියන්සේලාගේ කළුබණ්ඩා මැතිතුමා ඉතාම අනභිභවනීය ලෙස ඉෂ්ට කර තිබෙනවා. ඒ නිසා තමයි අද එතුමා ගැන අපට මේ විධියට කථා කරන්න පුළුවන්කම තිබෙන්නේ. පූර්ව කථාවලින් අපි දැක්කා, එතුමාගේ පවුලේ සාමාජිකයන්, දුවා දරුවන් කොහොමද මේ සමාජයට සේවය කර තිබෙන්නේ කියලා.

අවසාන වශයෙන් එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන ගමන් එතුමාගේ දරුවන් හට අනාගතයේදී මේ රට වෙනුවෙන් තවදුරටත් සේවය කරන්න හැකියාව ලැබේවායි ශුභාශිංසනය කරමින් මා නිහඬ වෙනවා.

[පූ.භා. 11.35]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ආර්.එම්.කේ.බී. රත්නායක හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා පරලෝ සැපත් වුණේ, 2014 වර්ෂයේ වුණත් එතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව ගෙන එන්නේ 2020දී. පඩුවස්නුවර ආසනය නියෝජනය කරන වර්තමාන සංවිධායකවරයා, එතුමා විශ්වාස කළ දේශපාලන ධාරාවේ වර්තමාන මන්ත්‍රීවරයා හැටියට මම ඉතාම ගෞරවයෙන්, ශෝකයෙන් ගරු කළුබණ්ඩා රත්නායක මැතිතුමා මේ අවස්ථාවේදී සිහිපත් කරන්නට අවශ්‍යයි.

පඩුවස්නුවර ආසනය කියන්නේ බොහොම කීර්තිමත් ඉතිහාසයක් තිබෙන නගරයක්; භූමියක්; පැරණි රාජධානියක්. එහි

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

මෑත යුගයේ ඉතිහාසය තුළ කළුබණ්ඩා රත්නායක කියන නාමය බොහොම ප්‍රතාපවත් විධියට සඳහන් වනවා. පඩුවස්නුවර මැතිවරණ කොට්ඨාසය හාහාපුරා බිහිවෙලා, එහි ආරම්භක මහජන නියෝජිතයා බවට පත්වෙලා, පඩුවස්නුවර ප්‍රදේශයට අර්ථයක්, නාමයක්, වටිනාකමක් ඇති කරපු යුග පුරුෂයා තමයි, ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමා. එතුමාට කිව්වේ "පඩුවස්නුවර රජ්ජුරුවෝ" කියලායි. එහෙම කියන්න අවශ්‍ය වූ පෞරුෂය රත්නායක මැතිතුමා ළඟ නොඅඩුව තිබුණා. බොහොම කෙළින් කථා කරන, කෙළින් වැඩ කරන, පුළුවන් නම් පුළුවන් කියන, බැරි නම්, බැහැයි කියන බොහොම ප්‍රායෝගිකව ප්‍රශ්නවලට මුහුණ දුන් ජනතා නායකයකු හැටියට "රජ්ජුරුවෝ" කියන අන්වර්ථ නාමයට එතුමා ගැළපුණා. අද ඉදිරිපත් වූ කථා කීපයකම ඒ සම්බන්ධයෙනුත් කියැවුණා. ඒ යුගයේ හැටියට, ඒ ප්‍රදේශය හැටියට, රජ කෙනෙකු, එහෙම නැත්නම් ප්‍රාදේශීය පාලකයකු හැටියට තමයි එතුමා ඒ කාල සීමාව තුළ එතුමාගේ දේශපාලන භූමිකාව ක්‍රියාත්මක කර ගෙන ගියේ.

පඩුවස්නුවර ආසනය තුළ කෘෂි කර්මය පිළිබඳව එතුමා විශාල විප්ලවයක් කළා.

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කියන්නේ සාමාන්‍යයෙන් යුරෝපීය පන්නය ප්‍රිය කළ නායකයෙක්. නමුත්, එතුමා විසින් සැලසුම් කළ වප් මඟුල හරහා "ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාටත් අමුඩය ගස්සවපු මනුස්සයා" කියන නාමයක් එතුමාට පට බැඳුණා. එතුමා සැලසුම් කළ එම වප් මඟුලට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාත් සහභාගි වුණා. මට මතකයි, එදා කුඩා පාසල් ශිෂ්‍යයන් හැටියට අපිත් ඒ ස්ථානයේ සිට එම අවස්ථාවට සහභාගි වූ බව. පඩුවස්නුවර ප්‍රදේශය පුරා කෘෂි කර්මය සම්බන්ධයෙන් විශාල පුනර්ජීවයක් එතුමා ඇති කළා. මා නියෝජනය කරන ආසනය තුළත් විශාල වැව් ප්‍රමාණයක් තිබෙනවා. එම ප්‍රදේශයේ තිබෙන වැව් විශාල ප්‍රමාණයක් සංවර්ධනය කරන්න එතුමා වැඩ කටයුතු කළා. කෘෂි කර්මය වෙනුවෙන් ගොවිජන සේවා මධ්‍යස්ථාන ඉදිකරමින්, වාරිමාර්ග පද්ධති ඉදිකරමින් එතුමා විශාල සේවයක් කළා.

එතුමාගේ දේශපාලන ජීවිතය ආරම්භ වුණේ ගම්සභාපති තනතුරෙන්. ඉන් පසුව එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු බවට පත්වුණා. නැවත ගම්සභාපති කියන තනතුර ප්‍රතිනිර්මාණය කරමින් එතුමා ප්‍රාදේශීය සභාවේ සභාපති හැටියට පත් වුණා. එතුමා තම දේශපාලන ජීවිතය අවසන් කළේත් ප්‍රාදේශීය සභා සභාපතිවරයකු හැටියටයි.

ඒ එක්කම පඩුවස්නුවර රජමහා විහාරය කේන්ද්‍ර කර ගෙන දළ දා නිමිති පෙරහැර ඇති කරමින්, ඒ සඳහා අරමුදලක් පිහිටුවා දීර්ඝ කාලයක් තිස්සේ යටපත් වෙලා තිබුණු පඩුවස්නුවර රාජධානියේ ආගමික ප්‍රබෝධය නැවත ඇති කරන්නටත් එතුමා විශාල වශයෙන් උත්සාහ කළා. මේ වනකොට පඩුවස්නුවර දළ දා නිමිති පෙරහැර ක්‍රියාත්මක වන්නේ නැහැ. මම 2015 දී පාර්ලිමේන්තුවට පැමිණියාට පස්සේ ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමාට කරන ගෞරවයක් හා උපහාරයක් හැටියට නැවතත් ඒ දළ දා නිමිති පෙරහැර එක්වරක් සංවිධානය කළා.

එතුමාට බොහොම කීර්තිමත් දරුවන් රාශියක් සිටිනවා. ගුරුවරුන්, විදුහල්පතිවරුන්, නීතිඥයන්, දේශපාලන නායකන්, හමුදා නිලධාරින් ඇතුළු මේ සමාජ තලයේ විවිධ වෘත්තීන්වලට පිවිසුණු, මේ සමාජයට විශාල සේවයක් කරන දරුමල්ලන් රාශියක්, දරු මුණුපුරන් රාශියක් එතුමාට සිටිනවා. එතුමා වෙනුවෙන් අපි ඒ අයට මේ අවස්ථාවේ දී අපේ ශෝකය පළ කරන්න අවශ්‍යයි.

කළුබණ්ඩා රත්නායක මැතිතුමා අධ්‍යාපනය වෙනුවෙන් විශාල සේවයක් කළා කියලා මේ අවස්ථාවේ දී කථා කරපු, ශෝකය පළ කරපු අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනා කිව්වා. ගරු කළුබණ්ඩා රත්නායක මැතිතුමා අධ්‍යාපනය වෙනුවෙන් කළ විශාලම සේවයක් තමයි පඩුවස්නුවර ඉදිකළ ජාතික පාසල. ග්‍රාමීය ප්‍රදේශයක් වන පඩුවස්නුවර ප්‍රදේශයට මධ්‍ය මහා විද්‍යාල සංකල්පය යටතේ මධ්‍ය මහා විද්‍යාලයක් හදලා, එතුමා එය ජාතික පාසලක් බවට පත් කළා. හැබැයි, පසුව නුසුදුසු දෙයක් සිද්ධ වුණා. මං හිතන හැටියට එතුමා අභාවප්‍රාප්ත වුණේ 2014 අවුරුද්දේයි. 1999.01.01 වන දින එතුමාගේ දෑස් ඉදිරිපිටදීම - එතුමා ජීවතුන් අතර සිටියදීම- එතුමා හදපු ඒ පාසල "එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික පාසල" නමින් නම් කරනු ලැබුවා. ඒ සිද්ධිය නිසා එතුමා විශාල කනගාටුවකින් හිටියා. බණ්ඩාරනායක මැතිතුමාට කරන අගෞරවයක් හැටියට නොවෙයි මම මේ කාරණය කියන්නේ. හෙට තමයි එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ ගුණානුස්මරණ දිනය යෙදිලා තිබෙන්නේ. එතුමාට කරන අගෞරවයක් හැටියට නොවෙයි මේ කාරණය මා කියන්නේ. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා මේ රටට විශාල සේවයක් කරනු ලැබූ ජාතික නායකයෙක්. හැබැයි, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා මේ රට තුළ ආරම්භ කරපු ආයතන වාගේම පාසල් - විවිධ දේවල්- විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ නමින් පඩුවස්නුවර පාසල නම් කළාය කියලා එතුමාට අලුත් නම්බු නාමයක් ලැබෙන්නේ නැහැ. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක කියන නම කවුරුත් පිළිගන්නවා. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක කියලා කියන්නේ මේ රටේ හිටපු කීර්තිමත් අගමැතිවරයෙක්. අපි එතුමාට ගරු කරනවා. එතුමාට කරන අගෞරවයක් හැටියට නොවෙයි මම මේ කාරණා කියන්නේ.

ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමනි, ඔබතුමන්ලාගේ රජය පිළිබඳවයි මම මේ කියන්නේ. මේ රට තුළ ඉදි කළ ආයතන ඕනෑ තරම් එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ නමින් නම් කරලා තිබෙනවා. හැබැයි, ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමා, එතුමාගේ ආසනය තුළ -ජන්ම භූමිය තුළ- ආරම්භ කරපු පාසල එතුමාගේ නමින් නම් කළා නම් එය එතුමා වෙනුවෙන් කරන්න තිබෙන විශාල ගෞරවයක් කියලා මම මේ අවස්ථාවේ දී මෙම ගරු සභාවට ප්‍රකාශ කරනවා.

ගරු බී.වයි.ජී. රත්නසේකර මැතිතුමාත් මේ අවස්ථාවේදී මෙම ගරු සභාවේ ඉන්නවා. එම පාසලේ නම වෙනුවට ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමාගේ නම ආදේශ කළාය කියලා එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා හැල්ලුවට පත් වෙන්නේ නැහැ. එහෙම කළාය කියලා එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාට මේ රට තුළ තිබෙන කීර්ති නාමය හා ස්ථානය වෙනස් වන්නේ නැහැ. 2015 ආණ්ඩුව පැවති කාලයේ මම ඒ කටයුත්ත කරන්න උත්සාහ කළා. නමුත් මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමා ඒ කටයුත්ත කරන්න ඉඩ දුන්නේ නැහැ. තමුන්නාන්සේලාට පුළුවන් නම් ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමා වෙනුවෙන් ඒ සාධාරණය ඉෂ්ට කරන්න කියලායි මම කියන්නේ. ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමා පිළිබඳව වූ ශෝක ප්‍රකාශ යෝජනාව පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ දී මම තමුන්නාන්සේලා සියලුදෙනාගේම අවධානය එම කාරණය කෙරෙහි යොමු කරනවා.

එතුමාගේ පවුලේ සියලුදෙනාට මගේ ගෞරවය හා ශෝකය මේ අවස්ථාවේ දී පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ.භා.11.44]

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ආර්.එම්.කේ.බී. රත්නායක, එහෙම නැත්නම් ගරු රත්නායක මුදියන්සේලාගේ

කළුබණ්ඩා රත්නායක මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන මේ අවස්ථාවේ එතුමා සම්බන්ධයෙන් කරුණු කිහිපයක් කථා කරන්න මා බලාපොරොත්තු වනවා.

අපේ කුරුණෑගල දිස්ත්‍රික්කය සුවිශේෂී තත්ත්වයක් උසුලනවා. එහි රාජධානි හතරක් -දඹදෙණිය, පඬුවස්නුවර, යාපහුව සහ කුරුණෑගල- තිබෙනවා. ඒ අතුරින් පඬුවස්නුවර රාජධානිය නියෝජනය කරමින් ක්‍රමානුකූලව දේශපාලනයට පිවිසිලා, ඒ දේශපාලනය තුළින් ඉදිරියට ආපු කෘතහස්ත දේශපාලනඥයකු හැටියට අපි ගරු කළුබණ්ඩා රත්නායක මැතිතුමා හඳුනා ගත්තා. එතුමා ගම් සභාව නියෝජනය කළා. ඒ වාගේම, ගම් සභා සභාපතිවරයකු හැටියට එතුමා දිග්ගල කොට්ඨාසය නියෝජනය කළා. දිග්ගල කොට්ඨාසය නියෝජනය කළ නියෝජිතයා හැටියට එතුමා එම ප්‍රදේශයට කළ සේවාව ගැන අදත් දිග්ගල කොට්ඨාසය අවට ග්‍රාම නිලධාරි වසම්වල ජනතාව අපි ඒ ප්‍රදේශවලට ගියාම ඉහළ අගය කිරීමක් ඇතිව මතක් කරනවා. පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව පිහිටුවීමෙන් පසුව පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට එතුමා පත් වුණා. එතුමා පඬුවස්නුවර ප්‍රදේශයට සුවිශාල මෙහෙවරක් කළ නායකයෙකු කියන කාරණය අපි කවුරුත් පිළිගන්නා කාරණයක්.

1977දී එතුමාට මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණා. 1977 වසරේ අවසන් වතාවට, කොට්ඨාස ක්‍රමය, එහෙම නැත්නම් කේවල මැතිවරණ ක්‍රමය අනුව පාර්ලිමේන්තුවට තේරී පත්වූ මහජන නියෝජිතයන්ට පුදුමාකාර ජනතා බැඳීමක්, ආකර්ෂණයක් තිබුණා. මොකද, ඒ මැතිවරණ ක්‍රමය අනුව මන්ත්‍රීවරයාටත් ජනතාව ඕනෑ, ජනතාවටත් මන්ත්‍රීවරයා ඕනෑ. එම නිසා හැමෝම කථා කළේ, "අපේ මන්ත්‍රීතුමා" කියලායි. සමානුපාතික මැතිවරණ ක්‍රමය ආවාට පසුව තමයි ඒ තිබුණු "අපේකම" ටිකෙන් ටික දුරස්ව ගොස් මේ තත්ත්වය ඇති වුණේ. එම කාල පරිච්ඡේදය තුළ -1970 -77 කාලයේ- පාර්ලිමේන්තුවට තේරී පත් වූ මන්ත්‍රීවරුන්ගේ නම් අදත් ජනතාවගේ හදවත් තුළට කිඳා බැස තිබෙනවා. ඒ, “අපේ මන්ත්‍රීතුමා” හැටියට ඒ ප්‍රදේශයේ ජනතා නියෝජිතයාට ඒ කොට්ඨාසයට විශාල වැඩ කොටසක් කරන්න හැකියාව ලැබීම නිසායි.

අපි දන්නවා, පඬුවස්නුවර, කුරුණෑගල කියලා කියන්නේ කෘෂිකර්මාන්තය මූලික කර ගත් ජන පදනමක් ඇති ප්‍රදේශ බව. ඒ කාලයේ අපේ රටේ තිබුණ සංවර්ධන වේගය එක්ක, අපේ රටේ තිබුණ ආර්ථික පසුබිමත් එක්ක කෘෂිකාර්මික ක්ෂේත්‍රයට කළ හැකිව තිබුණු යුතුකම් කළුබණ්ඩා රත්නායක මැතිතුමා ඉහළම මට්ටමින් ඉටු කළා. අනෙකුත් ක්ෂේත්‍ර ගත්තාම, එම කාල වකවානුවේ ඉතාම වැදගත් වන ආයුර්වේද මධ්‍යස්ථාන, ප්‍රාදේශීය වශයෙන් සෞඛ්‍ය මධ්‍යස්ථාන හා සාමාන්‍ය දරුවන් අධ්‍යාපනය ලබන ගම්වල තිබුණු කුඩා පාසැල් සංවර්ධනය කරන්නත් අවශ්‍ය වැඩ පිළිවෙළ නිර්මාණය කිරීමට එතුමා විශාල දායකත්වයක් ලබා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කළ සමාජ මෙහෙවර, මහජන මෙහෙවර අපි ඉතාම අගය කොට සලකනවා. එතුමා රත්නායක මැතිනියත් සමඟ එකතු වී මෙලොවට දායාද කළ ඒ දරුවන් යහ මඟට ගැනීමට සහ ඔවුන්ට නිසි අධ්‍යාපනයක් ලබා දීමට, ඔවුන් සමාජයේ හොඳ පුරවැසියන් බවට පත් කිරීමට ගොඩක් වෙහෙස මහන්සි වෙලා කටයුතු කර තිබෙන බව බොහොම පැහැදිලිව පෙනෙනවා. එක පැත්තකින්, එතුමාගේ අඩි පාරේ යන දේශපාලනඥයන් -මහජන නියෝජිතයන්- හැටියට චූල බණ්ඩාර මැතිතුමා, නිමල් බණ්ඩාර මැතිතුමා වැනි ඉදිරියට එන්න පුළුවන් කණ්ඩායමක් ගොඩ නැඟුවා.

මට මතකයි, නිමල් බණ්ඩාර මැතිතුමා පළාත් සභාවේ මහ ඇමතිවරයා හැටියට කටයුතු කළ කාලයේ මා දඹදෙණිය මධ්‍ය මහා විද්‍යාලයේ ගුරුවරයකු වශයෙන් සේවය කළා. ඒ පාසලේ අවශ්‍යතා වෙනුවෙන් මහ ඇමතිතුමා හමුවෙන්න ගිය වේලාවේ ප්‍රදේශයේ ප්‍රශ්න පිළිබඳව දීර්ඝ වශයෙන් අපි සාකච්ඡා කළා. දේශපාලන වශයෙන් කුමන මතය දැරුවත්, එතුමන්ලා ඉතාම යහපත් ආකාරයට සමාජයේ ප්‍රශ්න දිහා බලපු පිරිසක් කියන එක අපි හොඳටම දන්නවා. දේශපාලනඥයන් හැටියට දරුවන්ට ඒ මඟ විවර කර දුන්නා වාගේම, මේ රටේ ජාතික ආරක්ෂාව වෙනුවෙන්, මේ රටේ බෙදුම්වාදී ත්‍රස්තවාදය පරාජයට පත් කළ හැකි රණ විරුවන් බිහි කරන්නත් එතුමාට ශක්තිය උරුම වෙලා තිබුණා.

අහිංසක රෝගීන් සුවපත් කිරීම සඳහා වෛද්‍යවරුන් එම පවුල තුළින් බිහි වුණා. එමඟින් සෞඛ්‍ය ක්ෂේත්‍රයට විශාල සේවාවක් සිදු වුණා. අපි ආදරය කරන ඒ "ගුරු පවුර" එහෙම නැත්නම් ගුරු පරපුර වෙනුවෙන් නායකත්වය දෙන සාමාජිකයන් ඒ පවුලේ හිටියා. සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි දරුවන්ට අධ්‍යාපනය ලබා දීලා, ඔවුන් හරහා අපේ රටට විශාල සමාජ මෙහෙවරක් ඉටු කළ හැකි පරිසරයක් නිර්මාණය කළ, යුතුකම් ඉටු කළ පියාණන් කෙනකු හැටියටත් අපි මේ වේලාවේදී කළුබණ්ඩා රත්නායක මැතිතුමා සිහිපත් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා රෝගී වී සිටි පසුගිය කාල වකවානුවේ එතුමාගේ සුව දුක් බැලීම සඳහා යෑමට මට අවස්ථාවක් ලැබුණා. එක් අවස්ථාවකදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ මා එතුමාගේ නිවසට ගියා. එතුමාගේ පවුලේ ඥාතීන් සමඟත් කථා කළා. අපේ හිටපු ජනාධිපති, වර්තමාන අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට කළුබණ්ඩා රත්නායක මැතිතුමා රෝගාතුරව සිටිනවා කියන පණිවිඩය ලැබුණාට පසුව, එතුමා පඬුවස්නුවර ප්‍රදේශයේ සංවර්ධන කටයුතු නිරීක්ෂණය කිරීමට ගිය අවස්ථාවක කළුබණ්ඩා රත්නායක මැතිතුමාගේ නිවසට යන්නත් අමතක කළේ නැහැ. එහෙම ගිහිල්ලා, එතුමාගේ සුව දුක් බලලා පැරැණි හිතවත්කම් නැවත අලුත් කරගෙන එන්න එතුමා කටයුතු කළාය කියන කාරණයත් මේ වේලාවේදී මම විශේෂයෙන්ම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මීට වඩා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. විශේෂයෙන්ම, ගරු දයාසිරි ජයසේකර රාජ්‍ය අමාත්‍යතුමා අද මේ ගරු සභාවේ නැති වුණත්, කළුබණ්ඩා රත්නායක මැතිතුමා නියෝජනය කළ ප්‍රදේශයේ දීර්ඝ කාලීනව දේශපාලනය කරන කෙනකු හැටියට එතුමාගේ සංවේගයත් කළුබණ්ඩා රත්නායක මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ඒ පවුලේ ඥාතීන් වෙත මේ අවස්ථාවේදී පළ කර සිටිනවා. අදත් නම කියන්න පුළුවන් විදියට, මේ රටට, සමාජයට සුවිශාල මෙහෙවරක් සිදුකළ පඬුවස්නුවර හිටපු රජකු හැටියට අප අතරින් සමුගත්, පඬුවස්නුවර රාජධානිය නියෝජනය කළ කළුබණ්ඩා රත්නායක මැතිතුමාට නිවන් සුව අත්වේවායි කියා ප්‍රාර්ථනා කරමින්, දඹදෙණිය රාජධානිය නියෝජනය කරන මහජන නියෝජිතයා වශයෙන් මේ වෙලාවේ එතුමාගේ පවුලේ ඥාතීන් වෙත අපේ සංවේගය පළ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ.භා.11.51]

**ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා**
(மாண்புமிகு பீ.வை.ஜீ. ரத்னசேக்கர)
(The Hon B. Y. G. Rathnasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පඬුවස්නුවර ආසනය නියෝජනය කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ, ඊට එකතු වෙන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඉතිහාසයේ යම් තැනක පඬුවස්නුවර ආසනය ගැන ලියවිලා තිබෙනවා නම්, එහි සැලකිය යුතු පරිච්ඡේදයක් ගරු ආර්.එම්.කේ.බී.රත්නායක මන්ත්‍රීතුමා වෙනුවෙන් ලියැවී තිබෙනවා. පඬුවස්නුවර ගැන කථා කරන කෙනෙකුට, ආර්.එම්.කේ.බී.රත්නායක මැතිතුමා ගැන කථා නොකර ඒ කථාව පවත්වන්න බැහැ. එවැනි සේවාවක් එතුමා ඒ ප්‍රදේශයට ඉෂ්ට

[ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා]

කළා. අද කවුරුන් හෝ පඬුවස්නුවර ආසනය සිසාරා ඇවිදලා, නිම වී තිබෙන ඒ සංවර්ධන වැඩ බැලුවොත්, ඒ වැඩවලින් අතිමහත් බහුතරයක්ම ආර්.එම්.කේ.බී.රත්නායක මැතිතුමා මූලික වෙලා කළ දේවල් බව පෙනෙනවා.

පඬුවස්නුවර මධ්‍ය මහා විද්‍යාලය -සෙන්ට්‍රල් එක- ආරම්භ කරන වෙලාවේ එතුමා තුළ තිබූ සංකල්පය මට මතකයි. ඒ කාලයේ මම හෙට්ටිපොළ මහා විද්‍යාලයේ උසස් පෙළ හදාරන ශිෂ්‍යයෙක්. අපි තමයි, හෙට්ටිපොළ මහා විද්‍යාලයේ ශිෂ්‍යයන් හැටියට ගිහින් පඬුවස්නුවර මධ්‍ය මහා විද්‍යාලය හදන්න ඒ ඉඩම සුද්ද කළේ. අපි ඉඩම සුද්ද කර කර ඉන්නකොට රත්නායක මන්ත්‍රීතුමා ඇවිත් කෑම බීම ගෙනැත් දුන් ආකාරය මට අදටත් මතකයි. එතැන් පටන්ම එතුමා සක්‍රිය ලෙස ඒ ක්‍රියාදාමය තුළ හිටියා. ගරු ජනාධිපතිතුමා ඒ අවස්ථාවට පැමිණෙද්දී ඒ කාලයේ පිළිගැනීමේ ගීතය ගායනා කළ කණ්ඩායමේ මාත් හිටියා. ඒ පිළිබඳව මට අද වාගේ මතකයි. එතුමා ඒ පාසල හදා ගන්න දරපු වෙහෙස, උත්සාහය අපි ශිෂ්‍යයන් හැටියට පෞද්ගලිකව දැක්කා. පඬුවස්නුවර 'සෙන්ට්‍රල්' එක හදන්න එතුමා මූලිකත්වය ගැනීම සම්බන්ධයෙන් පඬුවස්නුවර ආසනයේ ජනතාව අදටත් එතුමාට ප්‍රණාමය පුද කරනවා.

මගේ ගම් ප්‍රදේශය බණ්ඩාරකොස්වත්ත ප්‍රදේශයයි. විශේෂයෙන්ම එතුමා තමයි බණ්ඩාරකොස්වත්ත නගරයට ජල සැපයුම ලබා දෙන්න මූලික වුණේ. ඒ කාලයේ වූ එක සිද්ධියක් මට අද වාගේ මතකයි. පුදුමාකාර ප්‍රායෝගික දැනුමක්, ඉංජිනේරුවන්ටවත් නැති මට්ටමේ දැනුමක් එතුමාට තිබුණා. ඒ අවස්ථාවේ මම හිටපු නිසා කවුරුවත් නොකියූ සිද්ධියක් මම කියන්නම්. බණ්ඩාර කොස්වත්ත නගරයට ජල සැපයුම් ලබා දෙන්න නළ ළිං ව්‍යාපෘතියක් එතුමා විසින් ආරම්භ කළා. ඒ නළ ළිඳ හදන ඉංජිනේරුවරයා ඇතුළු කාර්ය මණ්ඩලය ඇවිල්ලා ළිං තුනක් හැදුවා. ඒ ළිං තුනේම වතුර නැහැ. ජලය නැති නිසා එය නවත්වන්න වෙලා තිබෙන වෙලාවේ ගරු රත්නායක මන්ත්‍රීතුමා එම ස්ථානයට ආවා. මම ඒ අවස්ථාවේ එතැන හිටියා. ඒ වෙලාවේ මන්ත්‍රීතුමා වෙලේ එක ලියැද්දක් පෙන්වලා, "අන්න, අර මුල්ලෙන් මම කියනවාට තව සැරයක් හාරන්න, එතැන වතුර තිබෙනවා" කිව්වා. ඒ කාලයේ භූගත ජලය පරීක්ෂා කිරීමේ ක්‍රමවේද තිබුණේ නැහැ. ඒ නළ ළිඳ එතැන හැරුවා. එතැන ඕනෑවටත් වඩා වතුර තිබුණා. එතුමා ඒ කියපු තැන හදපු ඒ නළ ළිඳෙන් තමයි, අදටත් බණ්ඩාරකොස්වත්ත නගරයට වතුර දෙන්නේ. පාසල් ශිෂ්‍යයකු හැටියට මට ඒ වාගේ සිද්ධි කිහිපයක් මතකයි. අපි පාසල් ශිෂ්‍යයන් හැටියට දේශපාලනයට වැඩිය සම්බන්ධ වුණේ නැහැ; දේශපාලනඥයන් සෘජුව ඇසුරු කළේ නැහැ.

අපේ දේශපාලන මතිමතාන්තර කෙසේ වෙතත්, අපේ වීරයා බවට පත් වුණේ ගරු ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමායි. "පඬා වැව" සංකල්පය එතුමාගේ සංකල්පයක්. එය පැරණි වැවක්. පාණ්ඩවාපිය වැව ප්‍රතිනිර්මාණය කරන්න එතුමා දැවැන්ත උත්සාහයක් ගත්තා. එහිදී බොහෝ විරෝධතා, ගැටලු මතු වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාණ්ඩවාපිය වැව කෙසේ වෙතත්, එතුමාට කරන ගෞරවයක් හැටියට ඊට වඩා වෙනස් ජල ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අපි දැන් සැලසුම් සකස් කරමින් සිටිනවා. එතුමාට ගෞරවයක් හැටියට අපි එම ව්‍යාපෘතිය පඬුවස්නුවර ආසනය තුළ ක්‍රියාත්මක කරන්නට අපේක්ෂා කරනවා. බොහෝ දෙනෙකු එතුමා විසින් ඉටු කරන ලද සේවය ගැන අදහස් ප්‍රකාශ කළා. ඒ නිසා එම විස්තර නැවත නැවත කියන්න අවශ්‍ය නැහැ. නමුත්, පඬුවස්නුවර දළ දා පෙරහැර ගැන යමක් කිව යුතුයි. ඇත්තටම පඬුවස්නුවර රටට නිරාවරණය වුණා නම් ඒ නිරාවරණය වූ සිද්ධි දෙකක් තිබෙනවා. එකක් තමයි, පළමුවැනි වප් මඟුල. එම වප් මඟුල අවස්ථාවේ මම පාසල් ශිෂ්‍යයකු හැටියට වෙලේ හිටියා. පාසල් ශිෂ්‍යයන් ලෙස අපට තමයි එම උත්සවයේ බොහෝ කටයුතු පැවරිලා තිබුණේ. ඒ වප් මඟුල නිසා පඬුවස්නුවර ආසනය සමස්ත ශ්‍රී ලංකාව තුළ විශේෂයෙන් රාව ප්‍රතිරාව දෙන මට්ටමට පැමිණියා.

එසේම පඬුවස්නුවර දළ දා පෙරහැර එතුමාගේ සංකල්පයක් අනුවයි කරගෙන ගියේ. අවුරුද්දකට වරක් සමස්ත පඬුවස්නුවරම ඒකාලෝක වන මට්ටමේ වැඩ පිළිවෙළක් එතුමා ක්‍රියාත්මක කළා. අපි කුමන පක්ෂයක කුමන විධියට වැඩ කළත්, පඬුවස්නුවර ආසනයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සංවිධායකවරයා ලෙස මා එතුමාගේ සේවය අනිවාර්යයෙන්ම ඉතා ප්‍රශංසනීය ලෙස අගය කළ යුතු වෙනවා. අද එතුමාගේ පවුලේ ඥාතීන් මේ ගරු සභාවට පැමිණ සිටිනවා. දරුවන් එකොළොස්දෙනෙකු හැදීමම වීරවරයකුගේ චර්යාවක්. ඒ නිසා නිතැතින්ම එතුමා වීරයෙක් වෙලා අවසන්. අවුරුදු හයකට පස්සේ වුණත්, මේ ශෝක යෝජනාව වෙලාවේ එතුමා කළ සේවය වෙනුවෙන් පඬුවස්නුවර ආසනයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සංවිධායකවරයා ලෙස යළිත් මගේ ප්‍රණාමය පුද කරනවා.

මේ අවස්ථාවට එතුමාගේ පවුලේ නෑදෑ හිතවතුන් පැමිණ ඇති. එසේ නැතහොත් නිවෙස්වල සිට මෙම කථා අසනවා ඇති. ආර්.එම්.කේ.බී. රත්නායක මහතා ඉටු කළ සේවය අගය කරනවා වාගේම, එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ සැමට අපගේ සාතිශය සංවේගය පළ කරනවා. එතුමා බෞද්ධයකු ලෙස නිවන් සුව අත්වන මට්ටමේ බොහෝ පිංකම් ජනතාව වෙනුවෙන් සිදු කළා. ඒ පිනත් එතුමාට අනුමෝදන් වී එතුමාට මේ භව ගමනේ යම් කෙළවරකට යන්නට අවකාශ සැලසේවායි කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු ආර්.එම්.කේ.බී. රත්නායක මැතිතුමාගේ අභාවය පිළිබඳ පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයම විසින් කරන ලද ශෝක යෝජනා අනුමත කරමින් ගරු කථානායකතුමා සමඟ මම ද ඒ සමඟ එකතු වීමට කැමැත්තෙමි.

අද දින රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපත් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාට නියෝග කරමි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව පූ. භා. 11.59ට, 2020 ඔක්තෝබර් 06 වන අඟහරුවාදා පූ. භා. 10.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி மு.ப.11.59 மணிக்கு பாராளுமன்றம், 2020 ஒக்ரோபர் 06, செவ்வாய்க்கிழமை மு.ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 11.59 a.m. until 10.00 a.m. on Tuesday, 06th October, 2020.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.